ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

"ස්වාමීන් වහන්ස..., අවරුදු අතරතුරේ ඔබගේ ක්‍රියාකිරීම ප්‍රාණවත්ව කළ මැනව ..." (හබක්කුක් 3:2)

82 වන වෙළුම අංක 01 (967) **2023 ජනවාරි / පෙබරවාරි**

ස්වාමීන් වහන්සේ සෙවීමට කාලයයි

වෑන්ස් හැවනර් විසිනි.

"ධර්මිෂ්ඨකම පිණිස වපුරාගෙන කරුණාවේ ඇටියට කපාග නිල්ලා. පුරන්බිම කොටාගනිල්ලා. ස්වාමීන් වහන්සේ අවිත් නුඹලාට ධර්මිෂ්ඨකම වස්වන තුරු දැන් උන්වහන්සේ සොයන්ට කාලයයි. "(හොෂෙයා 10:12) අපගේ මාතෘකාව, ස්වාමීන් වහන්සේව සෙවීමට කාලයයි යනුය. දෙවියන් වහන්සේ පවසා තිබෙන්නේ මෙසේය. "නුඹලා මා සොයනවා ඇත. නුඹලාගේ මුළු සිතින් මා සොයන කළ මා නුඹලාට සම්බවෙනවා ඇත." (යෙරමියා 29:13) අපගේ දෙවියන් වහන්සේ, උද්යෝගිමත්ව උන්වහන්සේව සොයන අයට විපාක දෙන තැනැන්වහන්සේ වන සේක. නමුත් අපි උන්දුවෙන් උත්සාහ කළ යුතුය. (හෙබ්‍රෙව් 11:6) ඇමරිකාවට (අපගේ දේශයට) දැන් දණින් වැටීමට කාලයයි.

අපගේ රැස්වීම්වල සැලසුම් කොයිතරම් තිබුණත් ස්වාමීන් වහන්සේව සෙවීමට කාලයයි යන්න ඉහළින්ම තැබීම වඩාත් යෝග්‍ය වේ. අපි ස්වාමීන් වහන්සේව සෙවිය යුතු කෙසේදැයි හොෂෙයා අපට පවසා ඇත. (හොෂෙයා 10:12) ස්වාමීන් වහන්සේ ධර්මිෂ්ඨකමේ වැස්ස වස්වන්නට නම්, අපි අපගේ හදවත් නැමති පස සකස්කර ගත යුතුය. පුරන්බිම කොටාගෙන නොමැති නිසා එය ඵලදායි නොවේ. එලෙසම කිතුණුවන්ගේ හදවත් ඒත්තු ගැනීමේ නගුලෙන් අවුස්සා පසුතැවිල්ලට නොයන්නේ නම් දැඩි ලෙස වල්පැළෑටි සහ කටු ගස් වර්ධනයවී වැසී යයි. දෙවියන් වහන්සේ වර්ෂාව එවීමට පෙර අපි පොළොව සකස් කළ යුතුය. දෙවියන් වහන්සේ වර්ධනය ඇති කරන බව සත්‍යතාවයකි. නමුත් අපට ගොවිතැන් කිරීමට සිදුවේ. (1 කොරින්ති 3:6-7) කිසිම ගොවියෙකුට පුරන්බිම කොටාගන්නා තුරු බෝග වගා කළ නොහැකි අතර කිතුණුවන් ඔවුන්ගේ හදවත් පොඩි කිරීමට යොමු කරන්නේ නැතුව පිඹිදීමේ වර්ෂාවක් ඉල්ලා යාච්ඤා කිරීම අනුවන ක්‍රියාවකි.

අපගේම කාරණා සෝදිසි කරමු.

අපි අපගේම ජීවිතවලට කාරණා සෝදිසි කළ යුතු නගුල දමා පුරන්බිම කොටා, කටුක මුල් ඉරා දමා, තැලුණු, බිඳුණු හදවතක් දෙවියන් වහන්සේ ඉදිරියේ තැබිය යුතුය. උඩඟුකම ගැන පසුතැවිලි විය යුතුය. වන්දිය ගෙවිය යුතුය. දොස් පැවරීම ඒත්තුගත යුතුය. අමනාපකම්වලට සමාවදිය යුතුය. ප්‍රේම නොකිරීම ඉවත්කර දැමිය යුතුය. රන් කුඤ්ඤය හෙළිදරව් කළ යුතුය. (යොෂුවා 7:19-26)

"වක්නිසාද ස්වාමීන් වහන්සේ යුදාහි වනුෂ්‍යයන්ටත් යෝරැසලමටත් මෙසේ කියන සේක. කටු අතරේ නොව පුරා පුරන්බිම කොටාගනිල්ලා." (යෙරමියා 4:3) ඔබට පිඹිදීමක් නොතිබෙන්නේ නම්, ඒ ඔබගේ හදවත සීතලව හෝ නොසැලකිලිමත්ව තිබෙන නිසා නොවේද ..? අපි බොහෝ කාලයක් අපගේ හදවත් නැමති පුරන්බිම කොටා ගැනීමට සැලකිලිමත්වී නැත. එය විශාල මෙහෙයුමක් ලෙස පෙනෙනු ඇත. ඊට අමතරව පුරන්බිම කොටා ගැනීමට උත්සාහයක් අවශ්‍ය වන අතර අපි දැඩි උත්සාහයක් ගැනීමට කැමති නැත. ***"තමාගේ වචන සඟවාගන්නා සවල නොවන්නේය. එහෙත් ඒවා කියාදී අත්හරින්නාට කරුණාව ලැබේ."*** (හිතෝපදේශ 28:13)

ක්‍රිස්මස් එවන්ස් නැමති වේල්සයේ ශ්‍රේෂ්ඨ දේශකයෙක් දේශනා කිරීම සඳහා එක් සෙනසුරාදාවක කඳුකරය හරහා අශ්වයෙකු පිට නැග ගිය බව සඳහන් වේ. ඔහු සීතල හදවතක් ඇති වරදකරුවෙකු බව හැඟුණුවිට ඔහු තම අශ්වයාව ගැට ගසා තබා පැය හතරක් තම ආත්මය සෝදිසි කරමින් දෙවියන් වහන්සේව සෙවුවෝය. ඔහුගේ ආත්මය ප්‍රීතිමත් අත්දැකීමකින් ප්‍රබෝධමත් වූ අතර ශීත සෘතුවේ බිඳීම වැනි ප්‍රීතිමත් අත්දැකීමකින් ඉරිදා දේශනා කිරීමට ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස කරුණාවන්ත පිඹිදීමක් ආරම්භ වී මුළු සෙනඟ කෙරෙහි එය පැතිරී ගියේය.

අපගේ නිවස පිළිවෙලට සකසා ගනිමු

නිසැකවම අපගේ හදවත්වලට දැඩි ශීත සෘතුවක බිඳවැටීම වැනි දෙයක් අවශ්‍ය වේ. ඔබගේ හදවත පාළුව තිබෙන බව ඔබ පිළිගන්නවාද ..? දෙවියන් වහන්සේ ඔබගේ හදවත තුළ තිබෙන බව පෙන්වා දෙන පාපය පිළිගෙන පසුතැවිලි වෙනවාද ..? ඔබට පසුතැවිලිවීමට හැඟීමක් නැති නම් ඔබ එය පාපොච්චාරණය කර ඔබ කැමති වුවත් නැතත් ඔබ කළ යුතු දේ කිරීමට දෙවියන් වහන්සේගේ උපකාරය ඉල්ලා සිටිනවාද ?

අපි නැවත දෙවියන් වහනසේගේ කාල සටහන වෙත හැරෙමු. මෙය දෙවියන් වහන්සේගේ වැඩය කිරීමට කාලයයි. ස්වාමීන් වහන්සේව සෙවීමට කාලයයි. පිඹිදීමෙන් අධෛර්යමත් කිරීමට සමහර අය අනාගත වාක්‍යමය සත්‍යතාවය භාවිතා කිරීම පුදුමයකි. අපගේ ස්වාමීන් වහන්සේගේ නැවත පැමිණීමේ බලාපොරොත්තුවට වඩා පිඹිදීම උදෙසා විශාල වූ දිරිගැන්වීමක් නොමැත. පිඹිදීම වර්ධනය වන්නේ කාලය පිළිබඳ දැනුමෙනි.

"තවද කාලය දැන, එනම් දැන් නුඹලා නින්දෙන් පිඹිද සිටින්ට හරි වේලාව යයි දැන එසේ කරපල්ලා. මක්නිසාද අප අදහාගත් කාලයේ දී තිබුණාට වඩා දැන් ගැලවීම අපට ළඟ තිබේ." (රෝම 13:11)

පිඹිදීම යනු ශුද්ධවන්තයන් නින්දෙන් අවදිවීම හැර වෙන කුමක්ද ? ඇමරිකාව තුළ ඇති වූ එක් පිඹිදීමක් හැදින්වූයේ මහා පිඹිදීමක් ලෙසය. අප සිටින්නේ අන්තිම කාලයේ බැවින් බලවත් පිඹිදීමක් බලාපොරොත්තුවීමෙන් ඵලක් නැතැයි නිගමනය කරනවා වෙනුවට ගිවිසුම අලුත් කිරීමටත්, බෙතෙල් වෙත ආපසු හැරී යාමටත් අපගේ නිවස පිළිවෙලට තබා ගැනීමටත් යොමු වී හෙට දවසට අපගේ ජීවිත විශුද්ධ කිරීමට විරුද්ධව පවතින කාරණා ඉවත් කළ යුතුය.

දෙවියන් වහන්සේ සෝදිසියෙන් සිටින සේක

ක්‍රි.ව. 1600 ගණන් වලදී තම කාලයේ මනුෂ්‍යයන් කළ වූ පව් ගැන දුක් වූ බැරෑරුම් මනසක් ඇති පිරිමි ළමයෙකුව දෙවියන් වහන්සේ නැගිටෙවූ සේක. ඔහුගේ කාලයේ සියොන්හි සැහැල්ලුවෙන් විවේක ගැනීමට ඔහුට නොහැකි වූ නමුත් එංගලන්තය පුරා සම් ඇඳුමකින් සැරසී ගමන් කළේ දෙවියන් වහන්සේ කෙරෙහි සරල ඇදහිල්ලකට මිනිසුන්ව කැඳවමිනි. ඔහු නමින් ජෝර්ජ් ෆොක්ස් වන අතර ඔහු පැවසුවේ, "ස්වාමීන් වහන්සේ මට කීවේ ප්‍රේරිතයන් සහ අනාගතවක්තෘවරුන් සිටි ආත්මය තුළම සිටීමට එක් පුරුෂයෙක් හෝ ස්ත්‍රියෙක් උන්වහන්සේගේ මහත් බලයෙන් නැගිටවනු ලැබුවොත් ඔහු හෝ ඇය රට වටා සැතපුම් ගණනක් සොලවනු ඇති බවයි."

ශත වර්ෂ දෙකකට පසුව දැවැන්ත තද තරුණ කිතුණුවෙක් වූ හෙන්රි වර්ලි පවුසවේ.., " දෙවියන් වහන්සේට සම්පූර්ණයෙන්ම කැපවූ මිනිසා වෙනුවෙන් සහ ඔහු කරුණාකොටගෙන දෙවියන් වහන්සේ කරන්නේ කුමක්දැයි ලෝකය තවම දැක නැති බවයි." ඉන්පසුව ඩිවයිට් එල් මුඩි ඒ මනුෂ්‍යයාවීමට තීරණය කළේය. 1600 ගණන් වලදී එවැනි මනුෂ්‍යයෙකු සොයා දෙවියන් වහන්සේගේ දෙනෙත් ඒ මේ අතට දිව ගියේය. උන්වහන්සේ ජෝර්ජ් ෆොක්ස්ව සොයාගත් සේක. 1800 ගණන්වලදී මුඩිව සොයාගත් සේක. (2 ලේකම් 16:9) අපේ කාලයේ උන්වහන්සේ සොයා ගන්නේ කාවද ... ?

දෙවියන් වහන්සේ, උන්වහන්සේ සමඟ කටයුතු කිරීමට යොමුවන, තමන්ගේ සියලු මාර්ගවලදී උන්වහන්සේව සිහි කරන ස්ත්‍රීන් සහ පුරුෂයන් ගැන සෝදිසියෙන් සිටින අතර උන්වහන්සේ සැමවිටම ආශිර්වාදයෙන් සහ බලයෙන් එවැනි පුද්ගලයන්ව මුණ ගැසෙන සේක. දෙවියන් වහන්සේ ජොනතන් එඩ්වඩ්ව මුණ ගැසුණු සේක. (සොයාගත් සේක) ඉතිහාසයේ ඕනෑම අවදියක සෑම දෙයකින්ම දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට එකම මනුෂ්‍යයෙක් සිටිය හැකි බවට හෙළිදරව් වූයේ නම් මම ඒ මිනිසාවීමට මාගේ මුළු ශක්තියෙන් උත්සාහ කරමි. දෙවියන් වහන්සේට කැපවුණාවූ එබඳු මනුෂ්‍යයන්ට දෙනු ලබන පණිවිඩය ඔහුට ඇහුම්කන් දෙන අයට ලබාදිය යුතු අතර, එවිට සභාවේ කණු අමාරුවෙන් අල්ලාගෙන සිටින අය ස්වාමීන් වහන්සේ ඉදිරියේ බියෙන් යුතුව සිටිනවා ඇත. දෙවියන් වහන්සේ මීට වසර ගණනාවකට පෙර වේල්සය දෙස බැලූ සේක. පිඹිදීම උදෙසා බරක් ඇති, දැල්වෙන්නා වූ මනසක් ඇති ළමයෙකුව උන්වහන්සේ සොයාගත් සේක. ඔහු ස්වර්ගය පහතට කඩා පැමිණේවයි දෙවියන් වහන්සේට යාච්ඤා කරමින් ජීවත් විය. දෙවියන් වහන්සේ ඉතිහාසයේ බලවත්ම පිඹිදීමක් ඇතිව පැමිණිය සේක. ඉවාන් රොබට්ස් අරමුණු කල කාර්යය (ක්‍රියාදාමය) එයයි. දෙවියන් වහන්සේ ඔහුව මුණගැසුණු සේක.

ස්වාමීන් වහන්ස .... එය නැවත කළ මැනව

තම හදවතේ දේවස්ථානයේ සහ ලෝකයේ අවශ්‍යතාවය ගැන සැලකිලිමත්වන අය ගැන නිශ්චිතවම දෙවියන් වහන්සේ සෝදිසියෙන් සිටින සේක. එබඳු

2 පිටුවට

"දෙවියන් වහන්සේට ළංවෙයල්ලා. එවිට උන්වහන්සේ නුඹලාට ලංවන සේක" (යාකොබ් 4:8)

1 පිටුවෙන්

ස්වාමීන් වහන්සේ සෙවීමට...

මනුෂ්‍යයන්ට උන්වහන්සේ කරුණාව දක්වමින් අතීතයේ දී පිඹීදීම ලබා දෙමින් ආශිර්වාද කළ සේක. උන්වහන්සේට නැවත එය කළ හැකිය.

ගැලවීමේ හමුදාවේ ජෙනරාල් බුත්ගේ අවමංගල්‍යය දේව මෙහෙයෙන් පසුව රැස්ව සිටි විශාල සෙනකගෙන් යුක්ත සභාව දේවස්ථානයෙන් පිටත්ව ගිය පසුව සෙක්ස්ටන් හි දේවස්ථානයේ අල්තාරය ළඟ දණින් වැටී සිටි එක් මෙතොදිස්ත දේශකයෙකුව හමු විය. විලියම් බුත්ගේ ප්‍රබල ජීවිතය සහ ක්‍රියාව තුළින් දෙවියන් වහන්සේ කරන ලද දෙයින් පෙළඹී මෙම හුදකලා දේශකයා තම ආත්මයේ ගැඹුරින් යාච්ඤා කරමින් සිටියේ "ස්වාමීනී ..., එය නැවත කරන්න ස්වාමීනී .., එය නැවත කරන්න කියමිනි. "

"ඔව්" දෙවියන් වහන්සේට ස්වර්ගය විවිර කරගෙන උන්වහන්සේගේ ආත්මයේ බලවත් ක්‍රියා කිරීමක් ඇතිව නැවත පැමිණිය හැකිය. අපගේ හදවත් තුළ, අපගේ නිවෙස්වල, අපගේ දේවස්ථානවල, අපගේ ජාතියේ, අපගේ ලෝකයේ බලාපොරොත්තු රහිත මෙම අවශ්‍යතාවය සුපරාලීමට උවමනා වන්නේ එයයි. මම අදහස් කළේ ප්‍රසන්න කුඩා ආගමික උපවාසයකට හෝ සතිපතා අවධාරණය කරන අහිංසක ආත්මික තත්ත්වයකට වඩා වැඩි දෙයකි. මම අදහස් කළේ හුදු නිකායික මඟපෙන්වීමකට හෝ සුභාරංචි රැස්වීමක දැන්වීමකට වඩා වැඩි දෙයකි. විශාල සෙනගක් බොහෝ කාලයක් තිස්සේ මංමුලාවී සිටිති. අපි මේ සියලුම දේවල් කරන අතරතුර පාපය රඳවාගෙන සිටිය හැකිය. එවිට අපගේ ප්‍රශ්න කරදර පවතින්නේය. "ඔබගේ මාර්ගවලදී ඔබ සිහිකරන්නා වූ අයට ඔබ සම්බවන සේක. මෙන්න, ඔබ කෝපවූ සේක. අපි පව කළෙමුව. බොහෝ කලක සිට අපි ඒවායේ පැවතුණෙමුව. අපට ගැලවීම ලැබේද ... ? අපි සියල්ලෝම අපවිත්‍ර කෙනෙකු මෙන් වී සිටිමුව. අපේ සියලුම ධර්මිෂ්ඨකම් ද කිළුටු වස්ත්‍රයක් මෙන්ය. අපි සියල්ලෝම කොළයක් මෙන් පරවෙමුව. අපේ අයුතුකම්ද සුළඟ මෙන් අප පහකරගෙනයයි. (යොසායා 64:5-6) අපගේ පාප සහ අපරාධ දෙවියන් වහන්සේ සහ අපව වෙන්කර ඇත. (යොසායා 59:1-2) අපගේ තම ධර්මිෂ්ඨකම කිළුටු වැරහැල්ලක් මෙන්ය. එයට අපව ආවරණය කළ නොහැකිය. නමුත් අපවිත්‍ර වැරහැල්ලකින් අපව අපවිත්‍ර කළ හැකිය.

එබැවින් දෙවියන් වහන්සේගේ සභාව තුළ වැළපෙන්නන්ව පිඹීදීමට වඩා අඩු දෙයක් අවශ්‍ය නොවේ. එහිදී උන්වහන්සේගේ සෙනඟ දණින් වැටී පසුතැවිලිවෙමින් තමන්ගේ පාපය අතහැර පසුතැවිලිවීමට යොමුවේ. මන් ද අපි එසේ නොකළොත් දෙවියන් වහන්සේ අපේ පාපයට සමාවදී එය ඉවත් කරනු ඇතැයි අපට අපේක්ෂා කළ නොහැකිය. අප පාපය අත්හැර එයින් ඉවත්විය යුතුය. අපට පිඹීදීමක් අවශ්‍ය වන්නේ සිනමාහල් හිස්කර දේවස්ථාන පුරවා විවේචනය කරන්නන්ගේ කටවල් වසා දෙවියන් වහන්සේ කළ දේ උන්වහන්සේට නැවත කළ හැකි බව නොඇදිහිලිකාර ලෝකයට පෙන්වීමටය.

අපි අපවම ප්‍රබෝධමත් කරගනිමු

දෙවියන් වහන්සේව අල්ලා ගැනීමට මම මගේ ජීවිතය පොළඹවාගන්නේ කෙසේද ..? (යොසායා 64:7) ඔබගේ බයිබලය සමඟ හුදකලා වී, ඔබ පිළිබඳව ලැයිස්තුවක් සකස්කරගෙන දෙවියන් වහන්සේ ඉදිරියේ අවංකව ඔබගේ ජීවිතය අළුත්වැඩියා කරගන්න. සමහරවිට ෆිනී මහතාගේ යෝජනාවක් ඔබගේ ජීවිතයට ලබා ගැනීමට අවශ්‍ය වනු ඇත. කඩදාසියක් ගෙන ඔබගේ පාප දෙවියන් වහන්සේට ප්‍රකාශ කරන ලෙස ලියන්න. ඒ සඳහා කොපමණ කඩදාසි අවශ්‍ය වුවත් කමක් නැත. උඩඟුකම, කේන්තිය, රහසිගත පුරුදු, මැසිවිලි නැගීම යම් කෙනෙක් ගැන කීවා වූ දුෂ්ඨ වචන, ඔබ දෙවියන් වහන්සේගෙන් කොල්ලකෑම, ස්තුතිවන්ත නොවීම, දේව වචනය නොසලකා හැරීම ආදී සියලුම කාරණා වලින් පවිත්‍ර වෙන්න. ඒ සියල්ල ගැන පසුතැවිලි වී ඒවා අත්හරින්න. ඔබට යාච්ඤා කිරීමට හැගෙන්නේ නැති නම්, එය හැගෙන තුරු යාච්ඤා කරන්න. අපි පසුතැවිලි වෙමින් වුව හෝ උන්වහන්සේ සමාව ලබාදෙන බවට සහතික වී තිබෙන පොරොන්දු ඉල්ලා සිටිමු. (1 යොහාන් 1:9) ඔබ දෙවියන් වහන්සේ සමඟ කටයුතු කිරීමට අදහස් කරන්නේ නම්, උන්වහන්සේ ඔබව මුණගැසී ආශිර්වාද කරන සේක. ශුද්ධ ලියවිල්ලේ ප්‍රකාශ කරන පරිදි උන්වහන්සේ ඔබව මුණගැසී ආශිර්වාද කරන සේක. (යෙසායා 64:5)

මේ සඳහා මුළු රාත්‍රියම ගත වන්නේ නම් මුළු රාත්‍රියම ගතවීමට ඉඩහරින්න. නමුත් නැවත බෙතෙල්වලට හැරී ගොස් ගිවිසුම අලුත් කරගෙන ස්වර්ගය සමඟ නැවුම් විසඳුමක් ඇතිකර ගන්න. දෙවියන් වහන්සේ අහස විවර කරගෙන බැස එන තෙක් පිඹීදීම උදෙසා යාච්ඤා කරන්නා වූ සමාන අදහස් ඇති අය සමඟ ඔබත් එකතුවෙන්න. සැබවින්ම දෙවියන් වහන්සේ ක්‍රියා කිරීමට කාලය පැමිණ ඇත. මක්නිසාද අපි උන්වහන්සේගේ නියෝග අවලංගු කර ඇත. මෙය දෙවියන් වහන්සේ අහස පලාගෙන අතීතයේ දී පැමිණියාක් මෙන් පැමිණීමට කාලයයි. උන්වහන්සේ මීට පෙර ආශිර්වාදයේ වර්ෂාව ඇතිව එය කර තිබෙන සේක. දෙවියන් වහන්සේගේ සෙනඟ මේ කාර්යය උදෙසා උන්වහන්සේව අල්ලා ගැනීමට සොයන විට උන්වහන්සේ නැවත එය ඉටුකරනු ලබනවා ඇත.

පිබිදීම සඳහා යතුර

පෙරමග දූතයා මෙම කලාපය පිඹීදීම උදෙසා අපට තිබිය හැකි බලාපොරොත්තුව සහ පිඹීදීම උදෙසා දෙවියන් වහන්සේගේ සෙනඟ ලෙස උන්වහන්සේව සෙවීමට මංමුලාවී සිටින අපගේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කර ඇත. සමහර අය විශ්වාස කරන්නේ පවතින තත්වය ඉතා භයානක බවත්, තවත් පිඹීදීමක් එවීමට කාලය කෙටි බවත්ය. නමුත් එක් අවසාන ආත්ම වැගිරීමක් සිදුවන පිණිස උන්වහන්සේව විශ්වාස කිරීමට මේවා හේතුවේ. ක්‍රිස්තුස් වහන්සේ නැවත පැමිණීමට පෙර මේ අවසාන දවස්වලදී බොහෝ හදවත් අවදි කිරීමට උන්වහන්සේට අවශ්‍ය බව නිසැකය. සත්‍යය මෙයයි. දෙවියන් වහන්සේගේ සෙනඟ යටහත්වී යාච්ඤා කර, ඔවුන්ගේ නපුරු මාර්ග අතහැර, උන්වහන්සේගේ මුහුණ සොයමින් හැරී ගියහොත් කොයිරතම් අඳුරු තත්වයක් තිබුණත් ඉතා කෙටි කාලයකදී ජාතියක් තුළ දෙවියන් වහන්සේට අති විශිෂ්ඨ කාර්යයක් කළ හැකිය. (2 ලේකම් 7 : 13-14)

1904 - 1905 වේල්සයේ පිඹීදීම පිළිබඳ උදාහරණය දෙස බලන්න. පිඹීදීම ඇතිවීමට පෙර රටේ සමස්ත අධ්‍යාත්මික සහ සදාචාරමය තත්වය අඳුරු විය. නමුත් මේ අතර දේවභක්තික මනුෂ්‍යයන් තමන්වම යටත් කරගෙන යාච්ඤා කරමින්, දෙවියන් වහන්සේගේ මුහුණ සොයා ඔවුන්ගේ පාප වලින් හැරී ගියෝය. එහි ප්‍රතිඵලය ලෙස පළමු මාස හය තුළ පුද්ගලයන් ලක්ෂයක් ගැලවීමට පමුණුවමින් පිඹීදීම වැගිරවූ සේක. එය රට පුරා අධ්‍යාත්මික සහ සදාචාරාත්මක වාතාවරණයටත් ඉන ඔබ්බටත් බලපෑවේය.

ඇමරිකා එක්සත් ජනපදයේ 1857-1859 වර්ෂවල දී ඇති වූ පිඹීදීමේ උදාහරණය දෙස බලන්න. මෙම පිඹීදීම ඇති වූයේ අතලොස්සක් වූ දිව්‍යමය මැදහත්කරුවන්ගෙන් වූ අතර අවසානය වන විට මිලියන දෙකක් ගැලවීමට පැමිණ රට පුරා සදාචාරාත්මක වෙනස්කම් සිදුවූයේය.

අපගේ දවස්වලදී ස්වාමීන් වහන්සේට නැවත එය කළ හැකිද ... ? උන්වහන්සේට එසේ කළ හැකි බටවත්, එසේ කිරීමට උන්වහන්සේ කැමති බවටත් සැකයක් නැත. වඩාත් වැදගත් ප්‍රශ්නය නම් දෙවියන් වහන්සේගේ සෙනඟ වශයෙන් පුද්ගලිකව සහ සෙනඟක් වශයෙන් පිඹීදීම උදෙසා මුළු හදවතින්ම දෙවියන් වහන්සේව සෙවීමට අපි අපිවම පොළඹවා ගන්නවාද ..? (2 ලේකම් 7:14) පිඹීදීමේ යතුර ලෙස ස්වාමීන් වහන්සේ අප දෙස බලා සිටින සේක. අවාසනාවකට මෙන් බොහෝ මනුෂ්‍යයන් තමන්ගේ ප්‍රශ්න විසඳීමට දේශපාලනඥයන් හෝ නීති සම්පාදකයින් දෙස බලා සිටියි.

මේ සඳහා ඔවුන්ට යම් කාර්යයක් තිබුණ ද අපට අවශ්‍ය ආත්මික සහ සදාචාරාත්මක දියුණුව උදෙසා එකම බලාපොරොත්තුව ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීමයි. අත්ත වශයෙන්ම වේල්සයේ පිඹීදීම තුළ මෙම ලක්ෂන සලකා බලන්න. ඔවුන් දේශපාලන රැස්වීම් අතහැර දමන ලදි. කිසිවෙකු උනන්දුවක් නොදැක්වූ බැවින් එබඳු රැස්වීම් සම්පූර්ණයෙන්ම ප්‍රශ්නයෙන් බැහැර වූ බවක් පෙනෙන්නට තිබුණි. එංගලන්ත පාර්ලිමේන්තුව තුළ දේශපාලන නායකයන් පවා පිඹීදීමේ රැස්වීම්වලට ඔවුන්ගේ ජීවිත යොමු කළෝය. පිඹීදීමට දේශපාලඥයන් අවශ්‍ය නොවීය. දේශාපලඥයන්ටත් පිඹීදීම අවශ්‍ය විය. පිඹීදීම ආරම්භ වන්නේ ඉතිරි වූ දෙවියන් වහන්සේගේ සෙනඟ වඩා ඕනෑකමින් උන්වහන්සේව සෙවීම තුලිනි.

පිඹීදීම උදෙසා අවශ්‍ය වන දේ

පිඹීදීම උදෙසා අවශ්‍ය වන දේ පිළිබඳව වේලසයේ පිඹීදීමේ නායකයෙකු වූ ඉවාන් රොබට්ස් විසින් අවධාරණය කරන ලද මෙම කොන්දේසි හතර ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීම සඳහා අත්‍යවශ්‍ය බව සලකන්න.

රිවි කාමයිකල් විසිනි.

- ඔබේ අතීතයේ ඔබ දෙවියන් වහන්සේ ඉදිරියේ පසුතැවිලි නොවූ පාපයක් තිබේද ? නැවත වාරයක් ඔබේ දණින් හිඳ ඔබේ අතීත කාරණා උදෙසා පසුතැවිලි වී ඔබගේ ජීවිතය පවිත්‍ර කරගත යුතුය.

- ඔබගේ ජීවිතයේ සැක සහිත යමක් තිබේද ..? එය හොඳ හෝ නරක යන්න තීරණය කළ නොහැකිද ..? එය ඉවත් කරන්න. ඔබ සහ දෙවියන් වහන්සේ අතර බාධාවක් වන වළාකුලක හෝඩුවාවක්වත් නොතිබිය යුතුය. ඔබ සැම කෙනෙකුටම සමාවදී තිබෙනවාද ..? එසේ නොවේ නම් ඔබගේම පාපවලට සමාව බලාපොරොත්තු නොවන්න. එය ඔබට නොලැබෙනු ඇත. (මතෙව් 6:12, මාරක් 11:25-26)

- ආත්මයාණන් වහන්සේ ඔබව පොළඹවන දේ කරන්න. ක්ෂණිකව කීකරුකම ඇතිව ව්‍යාංග යෙන් ප්‍රශ්න නොකර ආත්මයාණන් වහන්සේට කීකරුවෙන්න.

- ක්‍රිස්තුස් වහ්නසේ ඔබගේ ගැලවුම්කරුවාණන් ලෙස ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්න. ඒත්තු ගැනීම සහ ප්‍රකාශ කිරීම අතර විශාල වෙනසක් ඇත.

මෙම අවසාන කොන්දේසිය කල්පනා කර බලන්න. සැබෑ පිඹීදීමේ දී කේන්ද්‍රීය අවධානය යොමු වන්නේ ක්‍රිස්තුස් වහන්සේට බව මතක තබාගන්න. උන්වහන්සේගේ මහිමය උදෙසා අපි මුළුහදවතින්ම පිඹීදීම සොයමු.

"එම්බා, අහස ඉහළින් පොද හෙළව, වළාකුල් ධර්මිෂ්ඨකම වගුරුවත්වා. ගැලවීම හටගන්න පිණිස පොළොව ඇරේවා ....." (යෙසායා 45:8)

ස්වර්ගය විවෘත විය

ජේම්ස් ඒ. ස්ටුවර්ට්ස් විසිනි.

වේල්සයේ පිඹීදීමේ නිර්මාතෘවරයා ඉවාන් රොබට්ස් නොවේ. වේල්සයේ පිඹීදීමේ නිර්මාතෘවරයා දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේ වූ සේක. 1904 නොවැම්බර් මාසයේ දී ඉවාන් රොබට්ස් පුවත්පත් සහ මහජනතාව ඉදිරියේ ජනප්‍රිය චරිතය බවට පත්වුවද වේල්සයේ බොහෝ ප්‍රදේශවල මෙම පිඹීදීම ඊට වසර දෙකකට පෙර ආරම්භ වූ බව සැලකිල්ලට ගන්න.

1904 වර්ෂයේ අගභාගයේ දී දෙවියන් වහ්නසේගේ ගංගාව උතුරා ගිය විට ආත්මයාණන් වහන්සේ උන්වහන්සේගේ භාජන වශයෙන් පාලකරුවන්ව, ඉවැන්ජලිස්තවරුන්ව සහ ගිහි සේවකයන්ව උන්වහන්සේගේ සේවය උදෙසා පාවිච්චි කළ සේක.

පිඹීදීමේ ආත්මයේ ක්‍රියාකාරිත්වය රටේ සෑම අස්සක්, මුල්ලක් නැරම ව්‍යාප්ත වූ අතර ඉවාන් රොබට්ස්ගේ සේවය එහි ප්‍රාන්ත දොළහෙන් එකක ප්‍රධාන වශයෙන් පැවතුණි. දෙවියන් වහන්සේගේ ගින්න ඉවාන් රොබට්ස් නොගිය නගරවල සහ ගම්වල ද ඇවිලුනි. එමෙන්ම ඔහු සංචාරය කළ බොහෝ ප්‍රදේශවල දැනටමත් ගින්න ඇවිලී ඇති බව ඔහුට පෙනී ගියේය. ඔහුගේ පැමිණීමෙන් ගින්න තවත් දැල්වීම සිදු විය.

සැබෑ පිඹීදීමේ ලක්ෂණ

පිඹීදීමේ දී ශුද්ධාත්මයාණන් වහන්සේගේ සැබෑ ක්‍රියාකාරීමේ එක් ලක්ෂණයක් නම් උන්වහන්සේ තම ක්‍රියාවන් හි එක් පුද්ගලයෙක් මත රදා නොතිබීමයි. පිඹීදීමේ දී මනුෂ්‍ය ක්‍රියාවක් තිබිය යුතු බව සැබෑය. ***"මාත් මා සමඟ සිටින සියලුදෙනාත් හෙරණෑ පිඹින විට නුඹලාත් වුළු කඳවුර වටකරන්ව හෙරණෑ පිඹ ස්වාමීන් වහන්සේ හා ගිඩියොන් උදෙසාය කියා කියපල්ලා යයි කීවේය". (විනිශ්චයකාරයා 7:18) "කෂ්ඨායව් තුනව හෙරණෑ පිඹ, කළගෙඩි බිඳ දමා වමතින් පන්දව් ද, පිඹින පිණිස දකුණතින් හෙරණෑ ද අල්ලාගෙන ස්වාමීන් වහන්සේගේ ද ගිඩියොන්ගේ ද කඩුව යයි මොරගැසුවෝය." (විනිශ්චයකාරයා 7:20) දෙවියන් වහන්සේ තම කාර්යය සඳහා*** කැඩුණු, පිරිසිදු භාජන සොයමින් පාවිච්චි කරන සේක. ඉවාන් රොබට්ස් එවැනි භාජනයක් ලෙස සොයාගත් සේක.

සැබෑ පිඹීදීමේ තවත් ලක්ෂණයක් වන්නේ පිඹීදීමේ ක්‍රියාවලිය මුදල්, සංවිධාන හෝ වෙළඳ දැන්වීම් මත රදා නොපවතින බවයි. ඔබට දෙවියන් වහන්සේගේ ගින්න සංවිධානය කිරීමට හෝ පාලනය කිරීමට නොහැකිය. මෙම පිඹීදීමේ විශ්මයජනක ලක්ෂණය වූයේ එය මුදල් මත රැඳී නොතිබීමයි. එහි ගීතිකා පොත් තිබුණේ නැත.

ගීතිකා මගපෙන්වන නායකයන් සිටියේ ද නැත. කමිටු හෝ ගීතිකා කණ්ඩායම් තිබුණේ නැත. සංවිධාන ද නොතිබුණි. පොන්ටිප්‍රිඩ් සාම්වරයා වරක් සඳහන් කළ පරිදි පිඹීදීම එයට අවශ්‍ය මූල්‍යමය උවමනාවන් සහ ප්‍රචාරණය සපයා ගනු ලබයි. එහි බිල්පත් නැත. කුලියටගත් ශාලාවක් නැත. වැටුපක් නොතිබුණි.

සැබෑ පිඹීදීමේ තවත් ලක්ෂණයක් නම් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙතට කේන්ද්‍රීය අවධානය යොමු කරනු ලබයි. ***"උන්වහන්සේ දවස් ගණනකට පසු කපර්ණාවුමට නැවත ඇතුල් වූ කළ උන්වහන්සේ ගෙයි සිටින බව ආරංචි විය."*** (මාර්ක් 2:1) ඉවැන්ජලිස්තවරයා හෝ ඉවැන්ජලිස්ත පක්ෂය ආකර්ෂණීය කේන්ද්‍රය නම් කාර්යය මාශයෙන් මිස දෙවියන් වහන්සේගෙන් නොවේ. ශුද්ධාත්මයාණන් වහන්සේ දේවස්ථානයක්, නරගයක් හෝ රටක් මත බලයෙන් යුක්තව ක්‍රියා කරන විට උන්වහන්සේගේම උපාය මාර්ග සහ උන්වහන්සේගේම ක්‍රියා කිරීමේ පිළිවෙල සමඟ පැමිණේ. වේල්සයේ පිඹීදීමේ දී එවැන්නක් අනුගමනය කිරීම පහසුය.

වේල්සයේ පිඹීදීමේ ලකුණු

එය තරුණ තරුණියන් උදෙසා පිඹීදීමක් විය. ඉවාන් රොබට්ස්ගේ වයස අවුරුදු විසිහයකි. දහස් ගණන් තරුණ තරුණියන් ගැලවීම වෙතට පැමිණියෝය. ඔවුන් ගැලවීම වෙතට හැරුණු විට සාක්ෂි දෙමින් සෑම තැනකම ගියේය. කුඩා දරුවන්ට ඔවුන්ගේම යාච්ඤා සහ ප්‍රශංසා රැස්වීම් තිබුණි. දේවස්ථාන තරුණ තරුණියන්ගෙන් පිරී ගියේය. එය ගායනයේ පිඹීදීමක් විය. දෙවියන් වහන්සේගේ ආත්මයේ හුස්මෙන් සෑමදෙයක්ම ගසාගෙන යන අවස්ථාවක් ගැන ඔබට සිතිය හැකිද .. ?

මෙම පිඹීදීමේ දී නායකයෙකු වූ ආර්.බී. ජෝන්ස් පැවසූ පරිදි ඇසෙන්නේ නම් මිස එය සිතාගත නොහැකි සහ අසනවිට විස්තර කළ නොහැකිය. ගීතිකා පොතක් නොතිබුණි. කිසිවෙකු ගීතිකාවක් ලබා දුන්නේ නැත. කවුරුන් හෝ ගායනාව ආරම්භ කළේය. ගීතිකාවක් ආරම්භ වූයේ කලාතුරකිනි. මේ මොහොතේ එකඟතාවයට නොගැලපෙන්නේ කාවදැයි කිසිවෙකු දැන සිටියේ නැත.

එකවර පටන්ගත් විට එකවරම ආවේගයකින් පෙළඹුණාක් මෙන් ගායනා කිරීමට නියමිත දේ ප්‍රකාශ කර ඇති අතර සියල්ලන්ටම පෙනෙන මානව (මිනිස්) නායකයෙකුගේ බැටන් පොල්ලකට ප්‍රතිචාරය දක්වන්නාක් මෙන් මුළු සභාවම මෙම ගීතය අල්ලා ගන්නා ලදි. මම එවැනි දෙයක් මින් පෙර දැක නැත. පුද්ගලයන් දහසක් හෝ එක්දහස් පන්සියයක් එකම ආත්මයක පෞරුෂත්වයක් ඇතිව ගොඩනැගී ඇති බව හැඟී ගියේය.

සිතුවිලි සහ අරමුණෙහි පරිපූර්ණ සම්මිශ්‍රණයක් වූ අතර එය දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ විසින් පමණක් නිර්මාණය කරන ලද බව සාක්ෂි දරයි. එය යාච්ඤාවේ පිඹීදීමක් විය. යාච්ඤාව බොහෝ දුරට ප්‍රශංසාව සමඟ මුසු විය. එය මොනරතම් පුදුමාකාර යාච්ඤාවක් ද... ? එය ස්වර්ගය විවෘත වන්නා වූ යාච්ඤාවකි. එහිදී යාච්ඤාවට කලින්ම පිළිතුරු ලැබුණි.

මැදහත්කාරකමේ යාච්ඤාව කොයිතරම් ප්‍රබල ලෙස වැගිරුණා ද කියනවා නම් මුළු සභාවම පැය ගණන් එකවර යාච්ඤාවට සහභාගි විය. දෙවියන් වහන්සේගේ ආත්මයාණන් විසින් කරුණාවේ සිංහාසනය වෙතට ගෙන යන විට තරුණයන් හා නූගත් අය එතරම් ආලේපයකින් හා බුද්ධියකින් යාච්ඤා කරනවා අසා ගැලවීම නොලැබුවා වූ අය පුදුමයට පත්විය. නමස්කාරය සහ දැඩි භක්තිය අසීමිත විය. ප්‍රශංසාවෙන් යුක්ත ඔවුන්ගේ යාච්ඤාවට ඒ මොහොතේම පිළිතුරු ලැබුණු විට ගැලවීම නොලැබුවාවූ ඔවුන්ගේ ප්‍රේමවන්තයන් රැස්වීම්වලට පැමිණ ගැලවීම ලැබූ විට එය අද දවසේ අපගේ යාච්ඤා රැස්වීම්වලට වඩා කොයිතරම් වෙනස් ද .. ?

එය ආත්ම දිනාගැනීමේ පිඹීදීමක් විය.

ස්වාමී වූ යේසුස් වහන්සේගේ ගැලවීමේ කරුණාව ගැන දේශනා කරන්නන් කිහිප දෙනෙකු සහ ඔවුන්ගේ දේවස්ථානයේ සාමාජිකයන් කිහිප දෙනෙකු සාක්ෂි දරනවා වෙනුවට වේල්සයේ සෑම කිතුණුවෙකුම විනාශ වී සිටින පුරුෂයන් සහ ස්ත්‍රීන් වෙනුවෙන් දැවෙන වේදනාවකින් සිටිය බව පෙනෙන්නට තිබුණි. සැබෑ ඇදහිලිවන්තයෙකු ගල් අඟුරු ආකරයේදී, ට්‍රෑම් රථයේදී, කාර්යාලයේ සහ පාසලේ දී තම තේජාන්විත මිදුම්කරු ගැන සාක්ෂි දැරීම ඉතා ස්වභාවික දෙයකි.

සාමාන්‍ය සංවාදයේ දී ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රකාශයන් ගැන කථා කළ සාමාන්‍ය පොදු ඇදිහිලිවන්තයන්ගේ පුද්ගලික සාක්ෂි දැරීම තුලින් දහස් ගණන් ගැලවීමට පැමිණියෝය.

අලුත් දවසක් උදාවිය

මනුෂ්‍යයන්ට නිදා ගැනීමට නොහැකි වූ අතර එසේ නොහැකිවීම පුදුමයක් නොවේ. ඔවුන්ට යාච්ඤා රැස්වීමෙන් ඉවත්ව යාමට නොහැකි විය. යාච්ඤා රැස්වීම අළුයම දෙක, තුන දක්වා පැවති අතර පසුව දෙවියන් වහන්සේගේ බැටළු පැටවාණන්ට ගී කියමින් මිනිසුන් සමඟ වීදි දිගේ ගමන් කිරීම පුදුමයක් නොවීය. දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය තුළ කඳු දියව ගියේය.

ස්වර්ගය විවර විය. වේල්සයේ සභාව තුළ අළුත් සහ ඔවුන්ගේ අනර්ඝ වූ ස්වාමීන් වහන්සේගේ මහිමාන්විත ලකුණු ප්‍රකාශ විය. ඔවුන් පිඹීදීමේ ප්‍රේම ගීතිය යන අදහසින් ගීතිකා ගායනා කළේය. වේල්සියට අලුත් දවසක් උදාවී තිබුණි. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සෙනඟ වෙතට පැමිණ ඔවුන්ව මුදවාගනිමින් සිටි සේක.

පිඹීදීම සඳහා සූදානම්වීම

පිඹීදීමට පෙර වේල්සයේ අඳුරු දවසක් විය. සෑම තැනකම බාර්, කාමර ඇති වී තිබුණි. පාපන්දු, කුකුල් පොර තැගි උදෙසා සටන් කිරීම, පරවියන් පියාසර කරවීම, ඔට්ටු ඇල්ලීම සූදුව ආදී දේවල් විශේෂයෙන්ම කම්කරු පන්තිය අතර ප්‍රචලිතව තිබුණි. බොහෝ අවස්ථාවලදී එකිනෙකා නොදන්නා මංමුලා සහගත ඇදිහිලිවන්තයන් හතලිස්දාහක් පමණ දේශයේ විවිධ ස්ථානවල සිට ස්වාමීන් වහන්සේ කෙරෙහි බලා සිටියෝය.

දෙවියන් වහන්සේ රහසිගතව තෝරාගත් භාජන අතර සූදානම් කළා වූ තරුණ පතල් කම්කරුවෙක් ද විය. ඔහු තම පරම්පරාවේ කැපී පෙනෙන හඬ විය. ඔහුව දෙවියන් වහන්සේ වැඩියෙන්ම පාවිච්චි කළේ ද නැද්ද යන්න විවාද කළ හැකි නමුත් මෙම බලවත් පිඹීදීමේ දී සියලු දේශකයන් අතරින් ඔහු වඩාත් ප්‍රසිද්ධ විය.

ඉවාන් රොබට්ස් උපත ලැබුවේ 1878 ජූනි මාසයේ අටවනදින "ලෝගර්" නම් කුඩා නගරයේ "අයිලන්ඩ් සවුත් " නම් සාමාන්‍ය වැඩ කරන මිනිසුන්ගේ කුටියකය. ඔහු ඉතා කුඩා අවදියේම පතල් වැඩ ආරම්භ කළේය. දේශනා කිරීමට දැඩි ආශාවක් ඔහුට තිබුණි. ඔහුගේ අධ්‍යාපනය ඉතා අල්ප වුවද ඔහුගේ දේවගැතිවරයා සහ වෙනත් අය ඔහුව ධෛර්යමත් කළේය. තරුණ ඉවාන් සහභාගි වූ මොරියා දේවස්ථානයේ උපස්ථායකයෙකු වූ විලියම්

4 පිටුවට

3 පිටුවෙන්

ස්වර්ගය විවෘත විය...

ඩේවිස් ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණෙන බැවින් යාච්ඤා රැස්වීම් අතපසු නොකරන ලෙස ඔහුට අනතුරු ඇඟවීය.

සදුදා සවස ඔහු මොරියා දේවස්ථානයේ යාච්ඤා රැස්වීමටද, අගහරුවාදා පිස්හාහී ද, බදාදා නැවත මොරියාහී ද, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා වෙනත් යාච්ඤා රැස්වීම් සහ බයිබල් පන්තිවලට ද සහභාගි විය. ඔහු වසර දහතුනක් පුරා ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලවත් පැමිණීම උදෙසා යාච්ඤා කළේය. 1904 දී පාසල හැරයාමට පෙර අන්වෙසක්වීමේ කන්ද මත ඉවාන් තම ජීවිතය සොයා ගත්තේය. ඉවාන් රොබට්ස් ඔහුගේම නිවසේදී, ගම්බද ප්‍රදේශවල දී දිව්‍යමය ආත්මනේ පූර්ණ වී පුදුමාකාර ලෙස ස්වර්ගීය පියාණන් වහන්සේව එළිදරව් කළේය. ඔහුට නිම් කාසල් එමලීන් හී ව්‍යාකරණ පාසලට ඇතුළත්වීමට කාලය ළංවූ විට ස්වාමීන් වහන්සේ සමඟ පැවති මෙම ආශීර්වාදලත් කාලය අහිමි වේ යැයි බියට පත් විය. දෙවියන් වහන්සේගේ ආලේපලත් මඟ පෙන්වීම යටතේ මේ වන විට එය ඔහුගේ පාසලේ සිට සැතපුම් අටක පමණ දුරින් පිහිටි "බ්ලැනනර්ච්" හි පවත්වනු ලැබීය. එකල එහි සිටි ඉවැන්ජලිස්තවරයා වූයේ සෙත් යොෂුවාය. 1904 සැප්තැම්බර් මාසයේ 29 වෙනි බ්‍රහස්පතින්දා උදෑසන ඉවාන් රොබට්ස් සහ ඔහුගේ සමීපතම මිතුරා වූ සිඩ්නි එවන්ස් ඇතුලු තවත් යෞවනයන් දහනව දෙනෙක් යාච්ඤා රැස්වීම්වලට සහභාගිවීමට "බ්ලැනනර්ච්" වෙත ගියෝය.

එදින හිමිදිරි උදෑසන ඔවුන් වාහනය ධාවනය කරගෙන යමින් ගීතිකා ගායනා කරද්දී දෙවියන් වහන්සේ ඔවුන්ගේ හදවත් තුළ ක්‍රියා කිරීමට පටන්ගත් සේක. ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය පැමිණේ. එය මට ලැබේ. යනුවෙන් ගායනා කරමින් තරුණ පිරිස නියමිත වේලාව වූ පෙ.ව. 7.00 ට නගරයට පැමිණ දේව මෙහෙයට සහභාගි විය. ඉවාන් ගැඹුරින් සහ වඩාත් බිඳුණු ස්වභාවයකට පත්වූයේ දේව මෙහෙය අවසන් කරමින් යොෂුවා මහත්මයා යාච්ඤා කරන විටදීය.

ස්වාමීන් වහන්ස අපව නැමුව මැනව

ඉවැන්ජලිස්තවරයා, ස්වාමීන් වහන්ස ....., අපව නැමුව මැනව යන වචන භාවිතා කරද්දී වේදනාවෙන් තිබුණු ආත්මයට වෙන කිසිවක් ඇසුණේ නැත. ඔබට අවශ්‍ය වන්නේ මෙයයි කියා දෙවියන් වහන්සේ රහසින් ඉවාන්ට කී සේක. ස්වාමීනී, මාව නැමුව මැනව කියා පැවසුවේ යොෂුවා මහත්මයා නොව දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ යැයි පසුව ඉවාන් රොබට්ස් පැවසුවේය. උදෑසන නවයට රැස්වීමේ මැදහත්කාරකමේ ආත්මය බලවත් විය. එවිට දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ ප්‍රසිද්ධියේ එලෙස මැදහත්කාරකම් කරන ලෙස ඔහුට කීවේය. මේ මොහොතේ දී ඔහුගේ ජීවිතයේ සිදු වූ මෙම පුදුමාකාර අත්දැකීම විස්තර කිරීමට ඉඩ දෙන්න. එහි ප්‍රතිඵලය ලෙස කෙටි කාලයකින් ලක්ෂයක් දෙනා ඇදහිල්ල තුළ ස්ථීර කරනු ලැබුවෝය.

මම මගේ දෑත් ඉදිරියේ තිබූ ආසනයට තබාගෙන දණින් වැටුනෙමි. කදුළු නිදහසේ ගලාගෙන ගියාය. "මාව නැමුව මැනව ..., මාව නැමුව මැනව..., අපව නැමුව මැනව ..., " කියා මම මොරගැසුවෙමි. දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ආඥාවලට නැමීමට මා කළ යුතු මොනවාද සහ උන්වහන්සේගේ ආඥාවලින් මා නොදැක තිබෙන්නේ මොනවාද කියා මොරගැසුවෙමි. ආත්මයාණන් වහන්සේ පැමිණ කුරුසියේ ප්‍රේමය මගේ හදවතට වැගිරවීමෙන් මාගේ හදවත දියව ගියාය. මේ අනුව සමස්ථ පිඹීදීමේ ක්‍රියාවලියේ තේමාව "කල්වාරියේ ආදරය" බවට පත්විය. **"නුඹත් දෙවියන් වහන්සේ අප කෙරෙහි ඇති තමන් වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස් වහන්සේ මරණය විඳීමෙන්ය."** (රෝම 5:8)
ඔහු තවදුරටත් මෙසේ කීවේය. මාගේ මුහුණේ දහඩිය වැගිරුණා ලේ එනවා කියලා හිතෙනකම් කදුළු ගලාගෙන ගියා වැඩි වේලාවක් යන්න කලින් ඩේවිස් මහත්මිය මගේ කඳුළු පිස දැමීමට ආවේය. මම මේ හැගීමෙන් සිටින විට සභාවේ සිටි අය හදවතින්ම ගායනා කළේ "මම එනවා ස්වාමීනී ඔබ වෙතට, නැති වූ ආත්ම ගැළවීම උදෙසා, දැන් විශාල බරක් මා වෙතට පැමිණියේය.., කියාය. "

පිඹීදීමේ බලපෑම

වේල්සයේ පිඹීදීමේ බලපෑම විශ්මයජනක විය. උදාහරණයක් වශයෙන් "ලිවර්පුල් ඩේල් පෝස්ට්" හි වාර්තාකරු 1904 දෙසැම්බර් මාසයේ වාර්තා කළේ පිඹීදීම ආරම්භ වූ දා සිට රෝස් හි බේබදුකම සම්බන්ධයෙන් කිසිවෙකු අත්අඩංගුවට ගෙන නොමැති බවයි. කම්කරුවන් උපයාගත් දේ මත්පැන්වලට හා නරක පුරුදුවලට නාස්ති කරනවා වෙනුවට දැන් ඔවුන්ගේ පවුල්වලට මහත් සතුටක් ගෙනදී ඇත. ගැලවීම වෙතට හැරුණා වූ තරුණ අය දහස් ගණන් ඔවුන් ගෙවීමට තිබූ හිඟ ණය ගෙවීමට යොමුවූවෝය. නැවත වන්දි ගෙවීම දවසේ ක්‍රියා පටිපාටිය විය. සුදු හා මත්පැන් ව්‍යාපාරවල වෙළඳාම අහිමි වූ අතර අනුග්‍රාහකයන් නොමැතිකමින් සිනමාහල් වැසී ගියේය.

මේ කාලයේ පාපන්දු ක්‍රීඩකයන්ට සහ පාපන්දු ක්‍රීඩා ලෝලීන්ට පාපන්දු ක්‍රීඩාව අමතකවී තිබුණත් දේශනා කුඩුවලදී ඒ ගැන කිසිවක් කතා කළේ නැත.

මනුෂ්‍යයන් දේශපාලන රැස්වීම් අතහැර දැමුවෝය. කිසිවෙකු උනන්දු නොවූ බැවින් ඒවායින් සම්පූර්ණයෙන්ම බැහැරව සිටි බව පෙණුනෝය. දේශපාලන නායකයන් ලන්ඩනයේ පාර්ලිමේන්තුවේ සිට පවා පිඹීදීමේ රැස්වීම්වලට තමන්ම යොමු විය. වඩාත්ම වැදගත්ම ප්‍රතිඵලය වූයේ දේවස්ථානවල පරණ අයහපත් දේ බිඳ වැටීමයි. මනුෂ්‍යයා විසින් සාදන ලද සභා සංවිධානවල බාධක සම්පූර්ණයෙන්ම බිඳ වැටුණි.

සියලු සභා සංවිධානවල ඇදිහිලිවතුන්, පාලකවරුන් එකට එකතුවී ඔවුන්ගේ තේජසේ ස්වාමීන් වහන්සේට නමස්කාර කළෝය. කිතුණුවන් අතරේ පැවති ආරවුල්. භේද සුවකරනු ලැබුවෝය.

පිඹීදීමේ කැපී පෙනෙන තවත් එක් ලක්ෂණයක් වූයේ ගැලවීම නොලැබූ අය අතර පමණක් නොව ගැලවීම ලැබූ අය අතරත් පසුතැවිලිවි වරද කියාදීම් සිදුවීමයි. ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය ඉදිරියේ සියල්ල බිඳී දියවී ගියේය. එහි පිඹීදීමෙන් ඇති වූ බලපෑම (ප්‍රතිඵලය) දේශීයව තබාගත නොහැකි විය. පිඹීදීම යනු සියල්ලට පෙර තෑග්ග බිම් කරා රැගෙන යන ගින්නක් මෙන්ය. අනපේක්ෂිත තැන්වලදී හැමෝවම විශ්මයට පත්කරවමින් එය එහෙන්, මෙහෙන් ඇවිලී යයි. වේල්ස් ජාතිය ගිලගත් මේ බලවත් ගින්න ඉක්මනින් පෘතුවියේ විවිධ ප්‍රදේශවලට පැතිරීයාම පුදුමයක් නොවීය. දැවෙන පඳුරේ දර්ශනය නැරඹීමට පැමිණි ආගන්තුක දේශකයන් සහ සාමාන්‍ය ඇදිහිලිවන්තයන් ඔවුන්ගේම දේවස්ථානවල සහ ධර්මදූත සේවයන්වල, නගරවල ගිනි ඇවිලවීමට ආපසු තම ස්ථානවලට ගියෝය. ලොව පුරා සිටින දෙවියන් වහන්සේගේ සෙනඟ ප්‍රීතියෙන් ඔල්වර හඬ නැගීමට පටන් ගත්තෝය.

සභාව නැමෙන්න

ඉවාන් රොබට්ස්ගේ තේමාව සභාව නැමීම සහ ලෝකය සුරැකීම සෑම සැබෑ පිඹීදීමකම රහස බව මතක තබා ගැනීම යහපත්ය. කිතුණුවන් නිහතමානී විය යතු අතර ආත්මයාණන් වහන්සේට ක්‍රියා කළ හැකි පරිදි දෙවියන් වහන්සේ සමඟ නිවැරදිවීම නිසා ගැලවීම නොලැබූ අය මත බලය නිදහස් වී ගැලවීම වෙතට ගෙන එනු ලැබීමට හැකි විය.

(2 ලේකම් 7:14) කුහකකමක් නැතිව කිතුණුවන් දෙවියන් වහන්සේගේ ආත්මය නිදහස්වීමට පෙර මුළුමණින්ම තම ජීවිතය දෙවියන් වහන්සේට යටත් කළ යුතුය. ශුද්ධාත්මයාණන් වහන්සේ දිව්‍යමය තැනැත්ත වහන්සේ ලෙස පිළිගෙන ගෞරව කළ යුතුය.

වේල්සයේ මනුෂ්‍යයන් කිසිදු පැකිලීමකින් තොරව වහාම උන්වහන්සේට කීකරු විය. මේ අනුව ඔවුන් ශුද්ධාත්මයාණන් වහන්සේගේ අභිෂේකය ලබාගත් අතර ඔවුන් ජයග්‍රාහී හමුදාවක් ලෙස පැතිරී ගියෝය. "දෙවියන් වහන්ස ..., නැවත වරක් ගින්න එවන්න. "

ඉවාන් රොබට්ස්ගේ යාච්ඤාව

"ජේසු සමිඳුනි .., ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මුහුණට මුහුණ පැමිණීමට අපට උපකාර කළ මැනව. කුමන බාධා පැමිණියත්. ඔබවහන්සේගේ සේවයට කැපවීමට අපට උපකාර කළ මැනව. අප සියලුදෙනාව යේසුස් වහන්සේගේ ලේ යටතේ තැබුව මැනව. අපගේ අතීතයේ සිට මේ මොහොත දක්වා සියලුම කාරණා යේසුස් වහන්සේගේ ලේ යටතේ තැබුව මැනව. යේසුස් වහන්සේගේ ලේ ගැන අපි ඔබවහන්සේට ස්තුතිවන්ත වන්නෙමු. "

"යේසුස් වහන්සේගේ නාමයෙන් සාතන්ව මේ මොහොතේ බැඳ දමන්නෙමු. අපි ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය මත රැඳී සිටින්නෙමු. එය අපගේ කුරුසිය සහ එය අපව ජයග්‍රහණයට ගෙන යනු ලබනවා ඇත. යේසුස් වහන්සේගේ නාමයෙන් කුරුසියේ මාර්ගය අනාවරණය කළ මැනව. ස්වර්ගය විවෘත කරගෙන අප වෙතට බැස ආව මැනව."

"අපගේ ආත්මය, ප්‍රාණය, ශරීරය ගෙන ගිය මැනව. අපි ඔබවහන්සේගේය. මක්නිසාද ඔබවහන්සේ අප මිලදීගත් සේක. ප්‍රේමණීය යේසුස් වහන්සේගේ කුරුසිය අනාවරණය කළ මැනව. ලෝකය ජය ගැනීමට අපව ක්‍රිස්තුස් යේසුස් වහන්සේගේ ලේ යටතේ තැබුව මැනව "

"මනුෂ්‍යයෝ අප ගැන පවසන දේ සිතීම වැළැක්වුව මැනව. යේසුනී..., ඔබ වහන්සේගේ වචන සැබවින්ම මිදි යුෂ වේ. යේසුනි, කුරුසියේ තේජසින් ඔබවහන්සෙ සෑම හදවතකම රජකම් කළ මැනව. "

"ඔබවහන්සේ ජයග්‍රහණයට හිමිකම් කියන්නා වූ සර්වබලධාරී දෙවියන් වහන්සේ වන සේක. අපි ඔබගේ නාමයට සියලු මහිමය දෙන්නෙමු. ඔබ හැර අන් කිසිවෙකුට මහිමයට අයිතියක් නැත. ස්වාමීනී ...., එය පිළිගත මැනව. මෙම රැස්වීමේ දී ඔබවහන්සේගේ පුත්‍රයා මහිමයට පැමිණෙවුව මැනව. ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුළ සහ අප තුලින් ක්‍රියා කළ මැනව. ඔබගේ නාමය උදෙසා ඔබගේ වචනයේ බලයෙන් කතා කළ මැනව. ආමේන් ....! ආමේන් ....! ආමේන් ....!

"එබැවින් ස්වාමීන් වහන්සේ ඇදිනගනිමු. ඇදිනගන්ට වීර්යය කරමු. උන්වහන්සේගේ උදාවීම පහන්වීම මෙන් ඒකාන්තමය" (හොෂෙයා 6:3)

පිබිදීමේ යාච්ඤාවෙන් පිබිදීමේ ගින්න අවුළුවයි.

වෙස්ලි එල්. ඩිවෙල් විසිනි.

නිශ්චල, උද්යෝගිමත්, වයස අවුරුදු 46 ක් වූ ව්‍යාපාරිකයෙකුව 1857 ජූලි මාසයේ පළමුවෙනිදා නිව්යෝර්ක් නගරයේ ඕලන්ද රෙපරමාදු සභාවේ මිෂනාරිවරයා ලෙස පත්කරනු ලැබීය. ජෙරමියා ලැම්පියර් වන ඔහු ෆිනී විසින් 1836 දී ආරම්භ කරන ලද බ්‍රෝඩ්වේ ටැබනැකල් දේවස්ථානයේ දී 1842 වර්ෂයේ දී ගැලවීම ලැබුවේය. ව්‍යාපාරිකයන්ට රැස්විය හැකි මධ්‍යාන සතිපතා යාච්ඤා රැස්වීමක් ආරම්භ කිරීමට දෙවියන් වහන්සේ තමාව මෙහෙයවන බව ලැම්පියර්ට හැඟුණි. මෙම මධ්‍යහන යාච්ඤා පැයට ඕනෑම කෙනෙකුට විනාඩි කිහිපයක් හෝ මුළු පැයම යාච්ඤා කිරීමට සහභාගි විය හැකිය. යාච්ඤාව සන්සන්දනාත්මකව කෙටි විය යුතුය. නිව්යෝක් හි පුල්ටන් වීදියේ පැරණි උතුරු ලන්දේසි රෙපරමාදු දේවස්ථානයේ තුන්වෙනි මහලේ ලැම්පියර්ගේ යාච්ඤා කණ්ඩායම රැස්විය. "මම කොපමණවාරයක් යාච්ඤා කළ යුතුද" යන මාතෘකාව සහිත යාච්ඤා රැස්වීම් නිවේදනය කරන අත් පත්‍රිකා කිහිපයක් ලැම්පියර් මුද්‍රණය කළේය. ඔහු මේවා සමහර කාර්යාලවල සහ ගබඩාවල තැබීය. ඔහු මෙයින් එකක් දේවස්ථානයේ වීදිය පැත්තේ දොරටුවේද අලවන ලදී.

යාච්ඤා රැස්වීම ආරම්භක දිනයේ දී එනම් 1857 සැප්තැම්බර් මාසයේ 23 වෙනිදා කිසිවෙකු නොසිටිය බැවින් ලැම්පියර් තනිවම පැය භාගයක් පමණ යාච්ඤා කළේය. නමුත් පැය අවසන් වන විට අවම වශයෙන් නිකායන් හතරක මනුෂ්‍යයන් හය දෙනෙක් ඔහු සමඟ එකතු විය. ඊළඟ බදාදා වන විට විසි දෙනෙකුත්, ඔක්තෝබර් හත්වෙනිදා වන විට හතලිහකට ආසන්න සෙනඟකුත් සිටියහ. මෙම යාච්ඤා රැස්වීම කොයිතරම් ආශීර්වාදයක් වුවාද කියනවා නම් ඔවුන් දිනපතාම රැස්වී යාච්ඤා කිරීම තීරණය කළෝය. සතියකට පසු සියයකට වඩා පැමිණ සිටි අතර ගැලවීම නොලැබුවා වූ අය ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන ඔවුන්ගේ පාපයේ වරදින් ගලවනු ලැබුවෝය.

මාසයක් ඇතුළත ෆුල්ටන් වීදියේ දහවල් යාච්ඤා රැස්වීම්වලට සහභාගි වූ දේවගැතිවරුන් උදෑසන ඔවුන්ගේ දේවස්ථානවල යාච්ඤා රැස්වීම් ආරම්භ කළොය. වැඩිකල් නොගොස් එලෙස යාච්ඤා රැස්වීම් පැවැත් වූ ස්ථාන පිරී ඉතිරී ගියහ. සියලුම නිකායන් වල ස්ත්‍රී, පුරුෂ , බාල, මහළු සියලුදෙනාම භේදයකින් තොරව එකට රැස්වී යාච්ඤා කළෝය. මෙම යාච්ඤා රැස්වීම්වල ක්‍රිස්තුස් වහන්සේට ඇති ප්‍රේමයත්, අනෙක් කිතුණුවන්ට ඇති ප්‍රේමයත්, යාච්ඤාවට ඇති ප්‍රේමයත් සාක්ෂි දැරීමට ඇති ප්‍රේමයත් බහුල විය. රැස්වී සිටින අයට දෙවියන් වහ්නසේ පැමිණ සිටින බව දැනෙන්නට විය ඔවුන් නිශ්චිත පුද්ගලයන් වෙනුවෙන් යාච්ඤා කර පිළිතුරු අපේක්ෂා කළ අතර පිළිතුරු ලබාගත්තෝය.

රැස්වීම්වල සහ යාච්ඤාවල අසාමාන්‍ය ස්වභාවය පුවත්පත් වාර්තා කළෝය. මාස තුනක් ඇතුළත එවැනි රැස්වීම් ඇමරිකාව පුරා පැතිරී ගියේය. දහස් ගණනක් මෙම සේවාවාන්හි සහ ඔවුන්ගේම නිවෙස්වල යාච්ඤා කිරීමට පටන් ගත්තෝය. නිව්යෝර්ක් හි දී පැමිණ සිටි අයට පත්‍රිකා බෙදා හරින ලද අතර, පත්‍රිකා ලබාගත් අය යාච්ඤා කර දෙවියන් වහන්සේ ඔවුන්ගේ සිතට හඟවා දෙන කෙනෙකුට ලබා දෙන ලෙසට උපදස් ලබා දුන්නෝය.

ෆුල්ටන් වීදියේ දේවස්ථානයේ කාමර තුනම පිරී ධාරිතාවය ඉක්ම ගිය බැවින් සිය ගණනකට වෙනත් ස්ථානවලට යාමට සිදු විය. පෙබරවාරි මාසයේ මුල වන විට ඒ අසල මෙතෝදිස්ත දේවස්ථානයක් පිහිටවනු ලැබූ අතර එහි සෙනඟ වහාම උතුරා යන්නට විය. සඳළුතල යාච්ඤාවට පැමිණි කාන්තාවන්ගෙන් පිරී තිබුණි. මාර්තු මාසයේ දහනව වෙනිදා වන විට යාච්ඤාව සඳහා ශාලාවක් විවෘත කළ අතර එහි යාච්ඤාව ආරම්භවීමට පැය භාගයකට පෙර ඉඩ මදිකම නිසා සෙනඟව හරවා යැවීමට සිදු විය. සිය ගණනක් එළිමහනේ සිටගෙන සිටියේ ඔවුන්ට යාච්ඤා රැස්වීමේ ස්ථානයේ ඉඩමදිකම නිසා ඇතුළට යන්නට නොහැකි බැවිනි. මාර්තු මාසය අවසන් වන විට නිව්යෝර්ක් නගරයේ යාච්ඤා රැස්වීම්වලදී දිනකට හය දහකට අධික පිරිසක් රැස්වූහ. බොහෝ දේවස්ථානවල යාච්ඤා මෙහෙයන් සඳහා සෙනඟව සවස්වරුවේ එකතු කරන ලදී. වැඩිකල් යන්නට ප්‍රථමයෙන් "මැන්හැටන්" සහ "බෘක්ලින් " හරහා සෑම දිනකම එක්සත් යාච්ඤා රැස්වීම් 150 ක් පැවැත්විය. පෙබරවාරි මාසයේ දී පිලදෙල්පියා හිදී ද ආරම්භ විය. වැඩි දවස් නොගොස් යෝධ ශාලාව පිරී ගියහ. සෑම දිනකම මධ්‍යහන යාච්ඤා රැස්වීම් පොදු ශාලාවල, ප්‍රසංග ශාලාවල, ගිණි නිවන ස්ථාන, නිවාස සහ කුඩා කුඩාරම්වල පැවැත්විය. මුළු නගරයේම යාච්ඤාවේ ආත්මයක් විහිදී ගියේය.

යාච්ඤා රැස්වීමේ උද්යෝගය

බොස්ටන්, බැල්ටිමෝර්, වොෂින්ටන්. ඩී.සී. රිච්මන්ඩ්, චාල්ස්ටන්, සවානා, මොබයිල්, නිව් ඔර්ලියන්ස්, විකිස්බර්ග්, සින්සිනැටි, මෙම්ෆිස්, ශාන්ත ලුවී, පීටර්ස්බර්ග්, චිකාගෝ සහ ඇමරිකාවේ තවත් බොහෝ ප්‍රදේශවල එකවරම දහවල් යාච්ඤා රැස්වීම් ආරම්භ විය. හතරවන මාසය අවසන් වන විට නගරබද සහ ගම්බද ප්‍රදේශවල සෑම තැනකම ජාතිය පුරා යාච්ඤාවේ උද්යෝගය දැඩි ලෙස ඇවිලී ගියේය. එය ශුද්ධාත්මයාණන් වහන්සේගේ පරමාධිපත්‍යයේ ක්‍රියාකාරිත්වය සහ දෙවියන් වහන්සේගේ සෙනඟගේ උද්යෝගිමත් කීකරුකම පිළිබඳ විශ්මිත වූ තේජාන්විත නිරූපණයක් ප්‍රකාශ කරනු ලැබීය.

ඇමරිකාව ඇදහිල්ලේ සහ යාච්ඤාවේ නව කාල පරිච්ඡේදයකට ඇතුල්වී ඇත. උගත්, නූගත්, දුප්පත්, ව්‍යාපාරිකයන්, නාකයන්, පොදු කම්කරුවන් සහ සියල්ලෝම යාච්ඤා කළෝය. විශ්වාස කළෝය. යාච්ඤාවට පිළිතුරු ලබාගත්තෝය. එක්සත් ජනපදයේ ජනාධිපති "ප්‍රැන්ක්ලීන් පියස් " පවා දහවල් යාච්ඤා රැස්වීම් බොහෝමයකට සහභාගි විය. මෙය බලගතු දේශනාවේ පිඹීදීමක් නොවීය. මෙය දැඩි බලවත්ව පැවතුණ යාච්ඤාවේ ක්‍රියාවලියක් විය. මනුෂ්‍යාන්ට අවශ්‍ය වූයේ යාච්ඤා කිරීමට ස්ථානයක් පමණි. පච්කරුවන් පැමිණ යාච්ඤා කරන ලෙස ඉල්ලා සිටියෝය. සමහර අය පුද්ගලිකව ඔවුන් වෙනුවෙන් යාච්ඤා කළෝය. විනාඩි කිහිපයකින් අලුතින් ගැලවීම ලැබූ අය ක්‍රිස්තුස් වහන්සේ තුළ ප්‍රීතිමත් වූවෝය. රට වටා ප්‍රේමණීයයන් වෙනුවෙන් සහ ගැලවීම නොලැබුවා වූ මිතුරන් වෙනුවෙන් ඔවුන්ගේ නමින්ම යාච්ඤා කළෝය. දිනකින් හෝ දෙකකින් යාච්ඤාවට දැනටමත් පිළිතුරු ලබාගනු ලැබූ බවට සාක්ෂි ප්‍රකාශ විය. සමහර නගරවල මුළු ජනගහනයම ගැලවීම වෙතට පැමිණියෝය.

ලැම්පියර්ගේ යාච්ඤා රැස්වීමේ ආරම්භයට මාස හයකට පෙර ස්වල්ප දෙනෙක් යාච්ඤා මෙහෙයන් සඳහා රැස්ව සිටියෝය. නමුත් දැන් දේවස්ථානයේ සැබෑ බලය හදිස්සියේම හෙළිවූවාක් මෙන් යාච්ඤාවේ ආත්මය දේශය අල්ලාගත්තේය. බොහෝ නිකායන්හි දේවස්ථාන බහුතරයක් යාච්ඤාවේ නව මානයක් අත්දැක ඇත. ප්‍රෙස්බෙටේරියන් සඟරාව වාර්තා කළේ මැයි මාසය වන විට පිඹීදීමෙන් ගැලවීම වෙතට හැරුණා වූ අය පනස්දාහක් වී ඇති බවයි. පෙබරවාරි මාසයේ දී නිව්යෝර්ක් මෙතෝදිස්ත සඟරාවක් සතියක් තුළ මොතෝදිස්ත රැස්වීම්වල ගැලවීම වෙතට හැරුණා වූ අලුත් ඇදහිලිවන්තයන් ගණන අටදාහක් බව වාර්තා කළෝය. ලුවිස්විල් දිනපතා පත්තරය මාර්තු මාසයේ සති තුනක් තුළ බැප්ටිස්ට් සභාව වෙතට එකතු කරනු ලැබූ අළුත් ඇදිහිලිවතුන්ගේ සංඛ්‍යාව දාහත්දහසක් බව වාර්තා කළෝය. ජූනි මාසයේ වාර්තාවට අනුව අලුතින් ගැලවීම ලැබුවා වූ අයගේ සංඛ්‍යාව 96216 ක් වූ අතර තවමත් එහි ගැලවීම ලබන අයව ගණන් කරමින් සිටියෝය.

පිඹිදීම පැතිරෙයි

1857-59 වර්ෂවල ඇති වූ මහා පිඹිදීම නගරබද ආරම්භ වී නගරවල, ගම්බද ප්‍රදේශවල පැතිරී යන ලදී. එය පාසල්වල ප්‍රබෝධයක් ඇති කළේය. පිඹිදීමේ උච්චතම කාලය තුළ සති හයේ සිට සති අට දක්වා සතිපතා මනුෂ්‍යයන් පනස්දාහක පමණ ගැලවීම වෙතට හැරුණෝය. වසර දෙකක් පුරාවට සෑම සහතියකම දේවස්ථානවලදී අලුතින් ගැලවීම ලැබුවා වූ අය දස දහසක් විය. වොෂින්ටන් ජාතික තොරතුරු වාර්තාවේ වාර්තා කරනු ලැබුවේ එංගලන්තයේ නගර කිහිපයකින් හැර ගැලවීම වෙතට හැරුණා වූ පුද්ගලයන්ව සොයාගත හැකි වූ බවයි. ප්‍රාන්තයන් ප්‍රාන්තයට පිඹිදීම වාර්තා විය. සමහර ස්ථානවල දේවස්ථානයේ සීනුව නාද කරමින් යාච්ඤා රැස්වීම්වලට සෙනඟව කැඳවනු ලැබීය.

වාර්තා කරන ලද දෛනික යාච්ඤා රැස්වීම් අතර මැසචුසෙට්ස් හි නගර 150 ක්, නිව්යෝක් හි 200 ක්, නිව්ජර්ස් හි 60 ක්, පෙන්සෙල්වේනියාවේ 65 ක්, ඔහියෝහී 200 ක්, ඉන්දියානා හි 150 ක් ලිනොයිස් හි 150 ක්, මිසුරි හි 50 ක් සහ අයෝවා හි 60 ක් විය. ඇමරිකා එක්සත් ජනපදයේ වෙසෙන මිලියන තිහක සෙනඟ අතරින් මිලියන දෙකකට ආසන්න පිරිසක් පිඹිදීමේ දී ක්‍රිස්තුස් වහන්සේ වෙතට දිනාගනු ලැබීය. රට පුරා සදාචාරමය වෙනස කොයිතරම් විශාල ද කියනවා නම් කොන්ටකි හි ලුසිස්විල් දෛනික පුවත්පත් වාර්තා කළේ සහස්‍රය පැමිණ ඇති බවයි.

1857-59 පිඹිදීම කිසිදු සංවිධානාත්මක ක්‍රියාවක් හෝ පිඹිදීම පිළිබඳව ප්‍රවර්ධකයින් ගැන පුරසාරම් දෙඩවීමක් නැත. විවිධ යාච්ඤා රැස්වීම් අතර සම්බන්ධීකරණයක් තිබුණේ නැත. ෆිනී හැර වෙනත් පිඹිදීමේ ඉවැන්ජලිස්තවරුන් නව එංගලන්ත ප්‍රදේශවල ක්‍රියාත්මක නොවීය. එම පිඹිදීම මනුෂ්‍යයන් විසින් සැලසුම් කරන ලද හෝ මෙහෙයවන ලද ක්‍රියාවක් නොවීය.

එය ගිහි සේවකයන් තුලින් ආරම්භ වූ ක්‍රියාවලියක් විය. බොහෝ දේවගැතිවරුන් ඊට සහභාගි වූ අතර ඔවුන් හැකි සෑම අවස්ථාවකම ඊට සහභාගිවීමට පැමිණියෝය. නමුත් ඔවුන් මෙම යාච්ඤා රැස්වීම්වලට නායකත්වය දුන්නේ නැත. බිෂොප්වරු යාච්ඤා රැස්වීම් දිරිමත් කර සහභාගි වූ නුමත් ඒවායේ මුලසුන දැරුවේ නැත. ඕනෑම කෙනෙකුට කොටි, නිශ්චිත යාච්ඤාවකට නායකත්වය දිය හැකිය. මිතුරෙකු සඳහා යාච්ඤාවක් ඉල්ලා සිටිය හැකිය. ගීතිකාවක පදයක් ආරම්භ කළ හැකිය. එය ආත්මයෙන් පොළඹවන ලද ආත්මයෙන් මඟ පෙන්වන ලද යාච්ඤාවේ ක්‍රියාවලියකි. මනුෂ්‍යයන් බැලීමට හෝ දැකීමට යාච්ඤාවේ රැස්වීම්වලට සහභාගි නොවීය. ඔවුන් සහභාගි වූයේ යාච්ඤා කිරීමට විය.

එක බීජයයි

ඇඟි හර්ස්ට් විසිනි.

ක්‍රි.ව. 1921 දී ඩේවිඩ් සහ ස්වේවා ෆ්ලඩ් නම් මිෂනාරි යුවලක් ස්වීඩනයේ සිට අප්‍රිකාවේ හදවත ලෙස හැඳින්වූ "බෙල්ජියන් කොංගෝව" දක්වා ඔවුන්ගේ මිෂනාරි සේවය සඳහා ගියහ. ඔවුන්ට තවත් ස්කැනඩිනේවියානු මිෂනාරි යුවලක් වන එරික්සන් මුණ ගැසුණෝය. ඔවුන් හතර දෙනාම දෙවියන් වහන්සේගේ මඟපෙන්වීම සෙවීය. බොහෝ මෘදු මොලොක් බව, භක්තිය සහ පරිත්‍යාගශීලී බව සහිතව ඒ දවස්වල ප්‍රධාන මිෂනාරී මධ්‍යස්ථානයෙන් පිටත්වී දුර බැහැර ප්‍රදේශයකට ශුභාරංචිය ගෙන යාමට ස්වාමීන් වහන්සේගේ මඟපෙන්වීම ඔවුන්ට දැණුනි.

මෙය විශාල ඇදහිල්ලේ පියවරක් විය. " එන්ඩොලේරා" ගම්මානයේදී එහි ප්‍රධානියා ඔවුන්ව ප්‍රතික්ෂේප කළ අතර තම ප්‍රදේශයේ දෙවිවරු තමන්ගෙන් ඇත්වේ යැයි බියෙන් මිෂනාරිවරුන්ට තම ගම්මානයට ඇතුල්වීමට ඉඩ ලබා දුන්නේ නැත. මෙම මිෂනාරි යුවල දෙක සැතපුම් භාගයක් පමණ කන්ද මුදුණට ගොස් ඔවුන් මඩ වලින් තමන්ගේ තාවකාලික නවාතැන් තනා ගැනීමට තීරණය කළෝය.

ඔවුන් ආත්මික වෙනසක් උදෙසා යාච්ඤා කළෝය. නමුත් කිසිවක් සිදු නොවීය. ගමේ අය සමඟ එකම සම්බන්ධය වූයේ කුඩා පිරිමි ළමයෙකු වන අතර ඔහුට සතියකට දෙවරක් කුකුළන් සහ බිත්තර විකිණීමට මේ මිෂනාරි යුවල දෙක අතරට යාමට අවසර ලැබී තිබුණි. "ස්වේවා ෆ්ලඩ්" අඩි හතරයි අඟල් අටක් උස කුඩා කාන්තාවකි. ඇයට කථා කිරීමට හැකි එකම අප්‍රිකානු ජාතිකයා මේ කුඩා ළමයා නිසා මේ කුඩා පිරිමි ළමයාව යේසුස් වහන්සේ වෙතට ගෙන යාමට උත්සාහ කිරීමට තීරණය කළාය. ඇත්ත වශයෙන්ම ඇය සාර්ථක විය.

නමුත් වෙනත් ධෛර්යමත් කිරීමක් තිබුණේ නැත. මේ අතරතුර මැලේරියාව මෙම කුඩා කණ්ඩායමේ එක එක සාමාජිකයාට එක පිට එක පහර දෙන්නට විය. කාලය ගතවෙද්දී එරික්සන් යුවල තමන්ට මෙම ජීඩනකාරී තත්ත්වය තවදුරටත් දරාගත නොහැකිව ප්‍රධාන මිෂනාරී මධ්‍යස්ථානයට නැවත හැරී යාමට පිටත් වූහ. ඩේවිඩ් සහ ස්වේවා ෆ්ලඩ් යුවළ එන්ඩොලේරා අසල තනිවම රැඳී සිටියහ. ඒ අතරතුර මෙම පාළුකරයේ දී ස්වේවා ෆ්ලඩ් ගැබ්ගෙන ඇති බව සොයා ගත්තේය. ඇයට දරු ප්‍රසූතියට නියමිත වේලාව පැමණි විට ගම්මුලාදැනියා ඇයට උපකාර කිරීමට වින්නඹු මාතාවකට ඉඩදීමට තරම් මෘදු විය. ස්වේවා දියණියක් බිහි කළ අතර ඔවුන් ඇයට "අයිනා " ලෙස නම් තැබීය.

කෙසේ වෙතත් දරු ප්‍රසූතිය වෙහෙසකර වූ අතර ස්වේවා ෆ්ලඩ් මැලේරියා රෝගයෙන් දුර්වල වී තිබුණි. උපත් ක්‍රියාවලිය ඇයගේ ශාරීරක ශක්තියට දැඩි බලපෑමක් ඇති කළාය. ඇය ජීවත් වූයේ දරු ප්‍රසූතියෙන් පසු තවත් දවස් දාහතක් පමණි. ඒ මොහොතේ ඩේවිඩ් ෆ්ලඩ් ඇතුළතින් කඩා වැටුණේය. ඔහු අපහසුවෙන් වලක් හාරා ඔහුගේ විසිහත් හැවිරිදි බිරිඳව භූමිදානය කළේය. පසුව ඔහුගේ බිළිදිය සමඟ නැවත මිෂනාරි මධ්‍යස්ථානයට ගියහ. ඔහුගේ අළුත උපන් දියණියව එරික්සන් යුවළට භාර දෙමින් ඔහු හඬා වැටෙමින් පැවසුවේ "මම නැවත ස්වීඩනයට යනවා. මට මගේ බිරිඳ අහිමි වුණා. මට පැහැදිලිවම මේ දරුවාව බලා ගැනීමට පුළුවන්කමක් නැහැ. දෙවියන් වහන්සේ මගේ ජීවිතය විනාශ කළා." ඔහු තම කැඳවීම පමණක් නොව දෙවියන් වහන්සේවත් ප්‍රතික්ෂේප කරමින් වරාය දෙසට ගමන් කළේය.

මාස අටක් ඇතුළත එරික්සන් යුවළ ද අද්භූත රෝගයකට ගොදුරුවී දින කිහිපයක් ඇතුළත ඔවුන් දෙදෙනාම මරණයට පත්විය. පසුව බිළිදියව තවත් ඇමරිකානු මිෂනාරි යුවළක් වෙත භාරදෙනු ලැබූ අතර ඔවුන් ඇගේ ස්වීඩන් නම වූ "අයිනා" , " ඇගී " ලෙස සකස් කර අවසානයේ දී ඇයට වයස අවුරුදු තුනේ දී නැවත එක්සත් ජනපදයට ගෙනයන ලදි. මෙම මිෂනාරි යුවළ ඇගීට ආදරය කළ අතර ඔවුන් නැවත අප්‍රිකාවට යාමට උත්සාහ කළහොත් යම් නීතිමය බාධාවක් ඇති වී ඇයව ඔවුන්ගෙන් වෙන්කරනු ඇතැයි බිය **විය. එබැවින් ඔවුන් තවත්ගේ වටි bටේව නතb වී සේවය කිරීමට තීbණය කළහ. මිෂනාරි සේවයේ සිට පාලකවbැන්ගේ සේවය දක්වා දකුණු "ඇකෝටාවේ" ඇගී හැදී හැසුණේ එලෙසය. තbැණියක් ලෙස ඇය "මිනියාපොලිස් " හි උතුbැ මැද බයිබල් විද්‍යාලයට ඇතුළත් වූවාය. එහිදී ඇයට "ඩිවෙයි හාර්ස්ට්" නම් තbැණයෙකු වුණ ගැසී ඔහු සමඟ විවාහ විය. අවුbදු ගෙවී ගිය අතb හාර්ස්ට් වලදායි දේව සේවයක් කbනු ලැබුවේය. ඇගී වුලින්ම දියණියක්ව සහ පසුව පුතෙකු බිහි කළාය. කාලයාගේ ඇවැමෙන් ඇගේ ස්වාමිපුbැෂයා " සියැටල්" ප්‍රදේශයේ ක්‍රිස්තියානි විද්‍යාලයක සභාපති බවට පත් වූ අතb එහිදී ඇය ස්කැන්ඩිනේවියානු උbැමයන් සොයා ගැනීමට උනන්දුවක් දැක්වූවාය.**

දිනක් ඇගේ තැපැල් පෙට්ටියේ ස්වීඩන් ආගමික සඟරාවක් තිබුනි. එය එවූවේ කවුරුන්දැයි ඇයට අදහසක් නොවූ අතර ඇත්ත වශයෙන්ම එය කියවීමට ඇයට නොහැකි විය. එහෙත් ඇය එම සඟරාවේ පිටු පෙරළද්දී එක්වරම එක් ඡායාරූපයක් ඇගේ සිතල නතර කළේය. එහි පිටුවක සුදු කුරුසියක් සහිත සොහොනක් තිබූ අතර කුරුසියේ "ස්වේවා ෆල්ඩ්" යන වචන විය. ඇය තම මෝටර් රථයට නැගී කෙලින්ම ගියේ ලිපිය පරිවර්තනය කළ හැකි ඇය දන්නා වූ බයිබල් විද්‍යාලයේ පීඨ සාමාජිකයෙකු වෙතය. මෙහි සඳහන්ව තිබෙන්නේ මොකක්ද කියා ඇය ඇසුවාය. උපදේශකවරයා එහි ඇති කථාව සාරාංශ කළේය. එය බොහෝ කලකට පෙර "එන්ඩොලේරා" වෙත පැමිණි මිෂනාරිවරුන් ගැනත්, ඔවුන්ට උපන් සුදු ජාතික ළදරුවෙකුගේ උපත ගැනත්, තරුණ මවගේ මරණය ගැනත්, ඔවුන් වෙත බිත්තර රැගෙන ගිය කුඩා පිරිමි ළමයෙකු ගැනත් ඔහු ක්‍රිස්තුස් වහන්සේව පිළිගැනීම ගැනත් සඳහන් කර තිබෙන බවද, ඉන්පසුව සුදු ජාතිකයන් සියලුදෙනාම ගමෙන් පිටත්ව ගිය පසු මෙම අප්‍රිකානු පිරිමි ළමයා තරුණයෙක්වී ගමේ පාසලක් සෑදීමට ගමේ ප්‍රධානියාව පොළඹවා ගත්තේය. ඔහු ක්‍රමක්‍රමයෙන් තම ශිෂ්‍යයන් සියලුදෙනාව ක්‍රිස්තුස් වහන්සේ වෙතට දිනාගත් බවත්. දරුවන් තම දෙමව්පියන්ව ක්‍රිස්තුස් වහන්සේ වෙතට රැගෙන ආ බවත්, ගමේ ප්‍රධානියා පවා කිතුණුවෙකු වූ බවත්, අද ඒ එක ගමක කිතුණු බැතිමතුන් 600 ක් සිටිති කියා සඳහන් වී ඇති බවත් කීවේය. එමෙන්ම මේ සියලුම දේ ඩේවිඩ් සහ ස්වේවා ෆ්ලඩ් නිසා සිදු වූ බවද සඳහන් වී තිබුණි.

යළි හමුවීම

හාර්ස්ට්ගේ විසි පස්වෙනි විවාහ සංවත්සර උත්සවය වෙනුවෙන් බයිබල් විද්‍යාලය ඔවුන්ට ස්වීඩනයේ නිවාඩුවක් සඳහා ත්‍යාගයක් පිරිනමනු ලැබී. ඇගී එහිදී තම සැබෑ පියාව සොයා ගැනීමට උත්සාහ කළාය. දැන් වයසක මනුෂ්‍යයෙක් වූ ඩේවිඩ් ෆ්ලඩ් නැවත විවාහ වී තවත් දරුවන් හතර දෙනෙකුගේ පියා වෙමින්, සාමාන්‍යයෙන් මත්පැන් සමඟින් ඔහුගේ ජීවිතය ගෙන ගියේය. ඔහු ඒ වන විට ආඝාතයට ගොදුරු වී සිටියේය. අසීරු තත්වයක සිටියත් ඔහු තම පවුල තුල එක් නීතියක් දමා තිබුණේය. එනම්, දෙවියන් වහන්සේගේ නාමය කිසිවිටෙකත් තම නිවසේ සඳහන් නොකරන ලෙසයි. "මක්නිසාද දෙවියන් වහන්සේ මගෙන් සියල්ල උදුරාගත්තා යැයි ඔහු කියා තිබුණේය. "

ඇගී ඇයගේ සුළු මවගේ දරුවන් වන තම සහෝදර සහෝදරියන් සමඟ නැවත හැගීම් වලින් එක්වීමෙන් පසුව තම පියා දැකීම පිළිබඳ මානෘකාව ගෙන ආවාය. අනෙක් අය පැකිළුණු නමුත් "ඔබට ඔහු සමඟ කථා කළ හැකියි. ඔහු දැන් ඉතා අසනීප තත්වයෙන් සිටියද දෙවියන් වහන්සේගේ නම ඇසෙන විට ඔහු කෝපයට පත්වන බව ඔබ දැනගත යුතු යැයි ඔවුන් කීවෝය." ඔවුන් ඇගීට බාධා නොකළෝය. ඇය සෑම තැනම මත්පැන් බෝතල් සහිත අපිරිසිදු මහල් නිවාසයකට ඇවිද ගිය අතර ගැහෙමින් ඇදක වැතිරී සිටිය හැත්තෑ තුන් හැවිරිදි තම පියා වෙත ඇය ළඟා වූවාය.

"තාත්තා ...." කියා ඇය අවිනිශ්චිතව පැවසුවාය. ඔහු හැරී අඬන්නට විය. "අයිනා" ඔහු කීවාය. මම කවදාවත් ඔයාව අතහරින්න හිතුවෙ නැහැ. කමක් නැහැ තාත්තේ, ඇය ඔහුව මෘදු ලෙස සනසාලමින් දෙවියන් වහන්සේ මාව බලාගත්තා කියා කීවාය. එවිට ක්ෂණිකවම ඔහු දැඩි විය. කඳුළු නතර විය. දෙවියන් වහන්සේට අපි හැමෝවම අමතක වෙලා. අපේ ජීවිත මේ වගේ වුනේ එයා නිසා කියා පවසා මුහුණ නැවතත් බිත්තිය දෙසට හරවා ගත්තේය. ඇගී තම පියාගේ මුහුණ පිරිමදිමින් නොපැකිලිව කථා කළාය.

තාත්තේ මට කියන්න පොඩි කථාවක් තියෙනවා. ඔයා අප්‍රිකාවට ගියේ නිකරුනේ නෙවෙයි. අම්මා නිකරුණේ මැරුණේ නැහැ. ඔයාලා ක්‍රිස්තුස් වහන්සේ වෙතට දිනාගත් පුතාට ඒ මුළු ගමම ක්‍රිස්තුස් වහන්සේ වෙතට දිනාගැනීමට පුළුවන් වුණා. ඔයාලා රෝපණය කළ එක බීජයක් වර්ධනය වෙමින් පැවතුණා අද අප්‍රිකානු සෙනඟ හයසියයක් දෙවියන් වහන්සේට සේවය කරන්නේ ඔබ ඔබගේ ජීවිතයේ දෙවියන් වහන්සේගේ කැඳවීමට විශ්වාසවන්තව සිටි නිසාය. තාත්තේ ...., යේසුස් වහන්සේ ඔයාට ආදරෙයි. උන්වහන්සේ කවදාවත් ඔයාට වෛර කලේ නැහැ.

මහළු මිනිසා ආපසු හැරී තම දියණියගේ දෑස් දිහා බැලීය. ඔහුගේ ශරීරය සුවවී නිදහස් විය. ඔහු කතා කරන්නට පටන්ගත්තේය. දහවල් වන විට ඔහු දශක ගණනාවක් තිස්සේ අමනාපවී සිටි දෙවියන් වහන්සේ වෙතට ආපසු හැරී ආවේය. ඊළඟ දින කිහිපය තුළ පියා සහ දියණිය එකට උණුසුම් අවස්ථාවන් භුක්තිවින්දාය. ඇගී සහ ඇගේ සැමියාට ඉක්මනින් ආපසු ඇමරිකාවට යාමට සිදු විය. සති කිහිපයක් ඇතුළත චේවිඩ් ෆ්ලඩ් තම සදාකාලික ගෘහය වූ ස්වර්ගයට ගියේය.

වසර කිහිපයකට පසුව හාර්ස්ට් යුවල එංගලන්තයේ ලන්ඩන් නුවර පැවති ඉහළ මට්ටමේ ඉවැන්ජලිස්ත සම්මන්ත්‍රණයකට සහභාගි වෙමින් සිටි අතර එහිදී "සයිරේ" ජාතියෙන් (අතීතයේ දී එය බෙල්ජියන් කොංගෝවේ) වාර්තාවක් ලබාදෙන ලදි. එහි බෞතිස්මය වූ ඇදහිලිවන්තයන් 110,000 ක් පමණ ඇදහිලිවන්තයන් නියෝජනය කරන ජාතික දේවස්ථානයේ ප්‍රධානියා තම ජාතිය තුළ සුභාරංචිය පැතිරීයාම පිළිබඳව චතුර ලෙස කථා කළයේ. ඩේවිඩ් සහ ස්වේවා ෆ්ලඩ් ගැන ඔබ කවදා හෝ අසා ඇද්දැයි ඇගී ඇසුවත් ඒ ප්‍රශ්නයට උත්තර ලබා ගැනීමට ඇගීට උපකාර කිරීමට කිසිවෙකුට නොහැකි විය.

"ඔව්", "මැඩම්" යැයි එම දේශකයා ප්‍රංශ භාෂාවෙන් පිළිතුරු දුන් අතර, ඔහුගේ වචන ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කළේය. "ස්වේවා ෆ්ලඩ් තමයි මාව යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙතට ගෙනාවේ. ඔබ ඉපදීමට පෙර ඔබේ දෙමව්පියන්ට ආහාර රැගෙන ගිය පිරිමි ළමයා මමයි. ඇත්ත වශයෙන්ම අද දක්වාම ඔබේ මවගේ සොහොන සහ ඇගේ මතකය අපගේ ගෞරවයට පාත්‍රවී ඇත. ඔහු ඇගීව වැළඳගත්තේ දිගු ලෙස ඉකිබිඳිමින්ය. ඉන්පසුව ඔහු කියා සිටියේ ඔයා ඒක බලන්න අප්‍රිකාවට එන්න ඕනේ. මොකද ඔයාගේ අම්මා අපේ ඉතිහාසයේ ප්‍රසිද්ධම කෙනායි.

කාලයකට පසු ඇගී හාර්ස්ට් සහ ඇගේ සැමියා අප්‍රිකාවට ගියේය. ගම්වැසියන් ප්‍රීති ඝෝෂා නගමින් ඔවුන් පිළිගනු ලැබීය. වසර ගණනාවකට කලින් තම පියා විසින් කුලී වැඩ සඳහා යොදාගත් පුද්ගලයාව පවා ඇයට මුණ ගැසුණාය. ඇගීව ඔන්චිල්ලා තොටිල්ලක දමා කන්දෙන් බැස්සීමට උපකාර කළේ ඔහුය.

වඩාත්ම හැගීම්බර අවස්ථාව වූයේ දේවගැතිවරයා ඇගීව තම මවගේ දේහය තැන්පත් කළ සොහොන ළඟ ඇති සුදු කුරුසිය දැකීමට රැගෙන යාමයි. ඇය යාච්ඤා කිරීමට සහ දෙවියන් වහන්සේට ස්තුති කිරීමට දණින් වැටුණාය. එදින දේවගැතිවරයා දේවස්ථානයේ දී කියෙවූ බයිබල් වාක්‍යය මෙසේය. **"සැබැවක්, සැබැවක්, නුඹලාට කියමි. ගෙඩුව බීජය පොළොවෙහි වැටී නොමලොත් තනිව තිබෙයි. නුවුත් මලොත් බොහෝ ඵල දෙයි."** (යොහාන් 12:24) ස්වේවා ෆ්ලඩ්ගේ සොහොන ළඟදී ඔහු මෙසේ කීවේය. **"කඳුළු සහිතව වපුාන්නෝ ප්‍රීතියෙන් කපන්නෝය. "** (ගීතාවලිය 126 :5)

"මොළොක් ගුණ ඇත්තෝ ඒ දැක සන්තෝෂවෙති. දෙවියන් වහන්සේ සොයන්නෙහි නුඹලාගේ සිත ජීවත්වේවා ..... , (ගීතාවලිය 69:32)

දෙවියන් වහන්සේ සමඟ ඔබව හඳුනාගන්න

සදාකාලික දෘෂ්ඨිකෝණයෙන් බලන විට මෙම පැයේ වඩාත්ම තීරණාත්මක අවශ්‍යතාවය විය හැකිවන්නේ සභාව ඇගේ දිගුකාලීන බැබිලෝනියානු වහල්කමින් ආපසු ගෙන ඒම සහ පැරණි ලෙසම දෙවියන් වහන්සේගේ නාමය ඇය තුළ මහිමයට පත්වීමයි. එහෙත් සභාව නිර්ණාමික ශරීරයක් හෝ ආශ්චර්යමත් ක්‍රියාවන් නැති ආගමික ස්ථානයක් ලෙස නොසිතිය යුතුය. කිතුණුවන් වන අප සභාව වන අතර අපි කුමක් කළත් සභාව කරන්නේ එයයි. එම නිසා මෙම කාරණය අප එකිනෙකාට පුද්ගලිකව තිබේ. සභාවේ ඕනෑම පියවරක් පුද්ගලයාගෙන් ආරම්භ විය යුතුය. සාමාන්‍ය කිතුණුවන් වන අපට ඉවත්ව ගිය තේජස නැවත ගෙන්වා ගැනීමට කුමක් කළ හැකිද .. ? අපට ඉගෙන ගත හැකි යම් රහසක් තිබේද ..? වර්තමාන අපේම තත්වයට අදාළ කරගත හැකි පුද්ගලික පිඹීදීම පිළිබඳව සැලැස්මක් තිබෙනවාද ? මෙම ප්‍රශ්නවලට පිළිතුර "ඔව්" යන්නයි.

එසේ වුවත්, පිළිතුර සමහර අයගේ බලාපොරොත්තුව පහසුවෙන්ම බැඳ දැමිය හැකිය. මන්ද ඒ පිළිබඳව ඕනෑම දෙයක් අපේක්ෂා කළ හැකිවන්නේ ගැඹුරු අධ්‍යනයකින්ය. මම විශේෂ දැනුමක් ඇති කිහිපදෙනෙකුට පමණක් තේරෙන සහ රහස් සංඛේත වලින් ලියවුණු දෙයක් අමාරුවෙන් සාමාන්‍යය භාෂාවට හරවා ගැනීමක් රැගෙන එනවා නොවේ. කිහිපදෙනෙකුට පමණක් අදහස් කරන ගුප්ත (රහස්) දැනුමක් නැත. මම ආයාචනා කරන්නේ නොදැණුවත්කම නිසා සැඟවුණු නියමයක් ගැනය. එහි රහස විවෘත එකක් වන අතර ඒ මාර්ගයේ ගමන් කරන්නාට එය කියවිය හැකිය. එය පැරණි සහ සදාකාලයටම නව උපදේශයකි. **"දෙවියන් වහන්සේ සමඟ ඔබව හඳුනාගන්න."** සභාවට අහිමි වූ බලය නැවත ලබා ගැනීමට නම්, සභාව ස්වර්ගය විවෘත වී ඇති බව දැකගත යුතු අතර දෙවියන් වහන්සේගේ චරිතය (ස්වභාවය) පිළිබඳව දර්ශනයක් තිබිය යුතුය.

එම නිසා දැකිය යුතු දෙවියන් වහන්සේ වන්නේ වර්තමානයේ ජනප්‍රියත්වයට පත්ව සිටින මනුෂ්‍යයන්ගේ කාර්යයන්වලදී ඒවා සාර්ථකත්වයට ගෙන ඒමට, ඔවුන්ගේ ඉල්ලීම්වලට පිළිතුරු ලබාදීමට උන්වහන්සේට ඇති හැකියාව නිසා සියල්ලන්ගේ ප්‍රසාදය සහ ප්‍රශංසාවට ලක්වන දෙවියන් වහන්සේ නොවේ. මෙයින් නොරැවටීමට සෑම දෙනාටම අනුග්‍රහය අවශ්‍ය වේ. අපි ඉගෙන ගත යුතු (දැනගත යුතු) දෙවියන් වහන්සේ ස්වර්ගයේ සිටින මහෝත්තම සර්වබලධාරී පියාණන් වහන්සේ වන දෙවියන් වහන්සේ අහස සහ පොළොවේ මැවුම්කාර, අපගේ ගැලවුම්කාර එකම ප්‍රඥාවන්ත දෙවියන් වහන්සේ වන සේක. පෘථිවි චක්‍රය මත වැඩ සිටින අහස තිරයක් ලෙස දිගහරින වාසය කිරීමට එය කුඩාරමක් ලෙස විහිදුවන ගණන් කළ නොහැකි තරු සේනාවන් පිටතට ගෙනවිත් උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය තුලින් ඒවාට නම් තබන්නා වූ දෙවියන් වහන්සේ වන සේක. උන්වහන්සේට රජවරුන්ගේ උපදෙස්වත්, රජ කුමාරවැන් කෙරෙහි විශ්වාසය තැබීමටවත්, මනුෂ්‍යයන්ගේ මාන්නයසහිත නිෂ්ඵල ක්‍රියාවන්වත් අවශ්‍යය නොවේ.

දෙවියන් වහන්සේගේ පැවැත්මේ එම ස්වභාවයන් ගැන අධ්‍යයනය කිරීමෙන් පමණක් දැනගත නොහැකිය. එය ස්වභාවික මනුෂ්‍යයා නොදන්නා, දැනගත නොහැකි ප්‍රඥාවකින් වන ආත්මිකව වටහාගත හැකි ප්‍රඥාවකින් පැමිණේ. දෙවියන් වහන්සේව දැන ගැනීම ලෝකයේ ඇති පහසුම සහ දුෂ්කරම යන කාරණා දෙකම එකවර ඇති දෙයයි. එය පහසුවන්නේ දැනුම දැඩි මානසික වෙහෙසකින් දිනා නොගන්නා නමුත් නොමිලේ ලබා දෙන දෙයක් නිසාය. හිරුඑළිය එළිමහනේ නොමිලේ පතිත වන්නාක් මෙන් ශුද්ධ වූ දෙවියන් වහන්සේ පිළිබඳව දැනුම ලබාගැනීමට විවෘත වන්නා වූ මනුෂ්‍යයන්ට නොමිලේ තෑග්ගක් ලෙස එය ලබාදෙන සේක. නමුත් මෙම දැනුම ලබැගැනීම දුෂ්කර වන්නේ සපුරාලිය යුතු කොන්දේසි සහ පාපයට වැටුණා වූ මිනිසාගේ මුරණ්ඩු ස්වභාවය නිසාය.

බයිබලයේ උගන්වන මෙම කොන්දේසි පිළිබඳව කෙටි සාරාංශයක් ඉදිරිපත් කිරීමට මට ඉඩදෙන්න. මේවා ලෝකයේ මෙතෙක් දැනගත් ශුද්ධ වූ සහ ශුද්ධවන්තයන් විසින් සියවස් ගණනාවක් පුරා නැවත නැවත පරිහරණය කළා වූ දේවල් වේ.

- ප්‍රථමයෙන්ම, **"අපි පාපය අත්හැරිය යුතුය."** නපුරු ජීවිත ගතකරන මනුෂ්‍යයන්ට ශුද්ධ වූ දෙවියන් වහන්සේව දැනගත නොහැකි බව තහවුරු කර ඇතැයි විශ්වාස කිරීම ක්‍රිස්තියානි ආගමට අළුත් දෙයක් නොවේ. වසර ගණනාවකට පෙර ලියන ලද "සාලමොන්ගේ ප්‍රඥාව" නැමති හෙබ්‍රෙව්වරුන්ගේ පොතේ පහත සඳහන් ඡේදය ලියවී ඇත පොළොව විනිශ්චය කිරීමට සිටින ඔබ ධර්මිෂ්ඨකමට ප්‍රේමකරන්න. යහපත් හදවතකින් සහ එක්ව ස්වාමීන් වහන්සේ ගැන සිතන්න. කාරුණික සිතකින් උන්වහන්සේව සොයන්න. මක්නිසාද උන්වහන්සේව පරීක්ෂා නොකරන අයගෙන් උන්වහන්සේව දැකගත හැකිය. උන්වහන්සේව විශ්වාස නොකරන අයගෙන් උන්වහන්සේව දැකිය නොහැකිය. වංක සිතුවිලි ඇති මනුෂ්‍යයා දෙවියන් වහන්සේගෙන් වෙන්වේ. මක්නිසාද ද්වේශ සහගත ආත්මයක් ඇති කෙනෙකුට ප්‍රඥාවේ තොල් නොමැත. පාපයට යටත්වන අයගේ ශරීර තුළ දෙවියන් වහන්සේ වාසය නොකරන සේක. මක්නිසාද ශුද්ධාත්මයාණන් වහන්සේ හික්මවන අතර වංචාව සමඟ උන්වහන්සේට සම්බන්ධකමක් නැත. උන්වහන්සේ අවබෝධයක් නැති සිතුවිලි ඉවත්කර දමනු ලබන අතර අධර්මිෂ්ඨකම පැමිණෙන විට එහි නොපවතින සේක. මෙම අදහසම දේවානුභාවයෙන් දෙනු ලැබූ ශුද්ධ ලියවිල්ල තුළ විවිධ ස්ථානවලට සඳහන් කර තිබෙන සේක. ඒ අතරින් වඩාත්ම ප්‍රචලිත වී ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේගේ වචන විය හැකිය. "සිතින් පවිත්‍රව සිටින්නෝ ආශිර්වාද ලද්දෝය. මක්නිසාද ඔවුහු දෙවියන් වහන්සේ දකින්නෝය." (මතෙවි 5:8)

- දෙවනුව .., **"අදහිල්ලෙන් වූව ජීවිතය තුළට ක්‍රිස්තුස් වහන්සේට කැපවීමක් තිබිය යුතුය. "** ක්‍රිස්තුස් වහන්සේව විශ්වාස කිරීම යන්නෙහි තේරුම මෙයයි. සෑම දෙයකදීම උන්වහන්සේට කීකරුවීමට ස්ථීර අරමුණක් සමගින් තම කැමැත්තෙන්ම උන්වහන්සේට සිතේ බැඳීමක් ඇතිව සිටීම එයට ඇතුළත් වේ. මෙයට අවශ්‍ය වන්නේ අපි උන්වහන්සේගේ ආඥාවන් පිළිපැදීම, අපගේ කුරුසිය දරා ගැනීම සහ දෙවියන් වහන්සේටත්, අනිත් මනුෂ්‍යයන්ටත් ප්‍රේම කිරීමයි.

- තුන් වෙනුව.., **"ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැඟිරීම සඳහා අපගේ වුලු ජීවිතයම විවෘත කිරීම මඟින් ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කිරීම තුළ දෙවියන් වහන්සේට ජීවමාන යාගයක්වීමට අපගේ පාපයට මිය යා යුතුය. "** අවශ්‍ය ඕනෑම ස්වයං විනයක් පුහුණු කළ යුතු අතර මාංශයේ තෘෂ්ණාව අපගේ දෙපා යට පාගා දැමිය යුතුය.

- හතර වෙනුව.., **"අපි නිර්භීතව සිට පහතට වැටුණු ලෝකයේ ලාභ ඉපදවීමේ කාර්ය ප්‍රතික්ෂේප කළ යුතුය."** නොඇදහිලිවන්තයන් තම හදවත් යොමු කරන සෑම දෙයකින්ම මුළු ආත්මයෙන් සම්පූර්ණයෙන්ම වෙන් විය යුතුය. දෙවියන් වහන්සේ සාධාරණ හා යුක්තියට එක හා සමානව ලබා දී ඇති සොභාදහමේ සරලම වින්දනයට පමණක් ඉඩදිය යුතුය.

- පස් වෙනුව.., **"දෙවියන් වහන්සේගේ තේජාන්විතභාවය පිළිබඳව දීර්ඝව හා ආදරයෙන් වෙනෙහි කිරීමේ ස්වභාවය අපි පුරුදු කරගත යුතුය."** මේ සඳහා යම් උත්සාහයක් දැරීමට සිදුවනු ඇත. මක්නිසාද තේජාන්විත සංකල්පය මිනිස් වර්ගයාගෙන් සම්පූර්ණයෙන්ම අතුරුදහන්වී ඇත. මිනිසාගේ උන්නදුවෙහි කේන්ද්‍රස්ථානය දැන් ඔහුම වී ඇත. මානව වාදය එහි විවිධ

එ. ඩබ්. ටෝසර් විසිනි. (1897-1963)

ස්වරූප වලින් පැමිණ ජීවිතය පිළිබඳ අවබෝධය සඳහා යතුර දේවධර්මය බව බැහැර කර ඇත. දහනව වන සියවසේ කවියෙකු වූ "ස්වන් බර්න්" "ඉහලින් මිනිසාට මහිමය, මක්නිසාද මිනිසා දේවල ස්වාමියාය." යනුවෙන් ලියූ විට ඔහු නූතන ලෝකයාට එයින් නව පණක් ලබා දුන්නේය. මේ සියල්ල හිතාමතාම කැමැත්තේ ක්‍රියාවකින් ප්‍රතික්ෂේප කර ආපසු හැරවිය යුතු අතර මහත් ඉවසිලිවන්ත ස්වභාවයකින් එලෙස කිරීම පවත්වාගත යුතුය.

දෙවියන් වහන්සේ පුදගලයෙක් වන සේක. අපි එය අපගේ හදවත් වලින් හඳුනාගැනීම වර්ධනය කරගන්නා විට සමීපව දැන ගැනීම වැඩිකර ගත හැකිය. දෙවියන් වහන්සේ පිළිබඳ අපගේ පැරණි විශ්වාසයන් පූජාසනය මත තබා ශුද්ධ ලියවිල්ලේ සඳහන් මහිමයේ ආලෝකයෙන් අපගේ අභ්‍යන්තර ජීවිතය ආලෝකමත් කරගත හැකිය. ඉවැන්ජලිස්ත දේවස්ථාන අතරේ පවතින තර්ක විතර්ක අපි නිශ්චලව සහ කාරුණිකව බිඳ දමමින් ක්‍රිස්තියානි ධර්මයට සිදුවන බොහෝ දේවල නිස්සාර ස්වභාවයට විරෝධය දැක්වීමටත් අපට සිදු විය හැකිය. මෙයින් අපට කාලීනව මිතුරන් අහිමිවිය හැකි අතර ශුද්ධකමට වඩා නැඹුරු වූ අය ලෙසට පත්විය හැකිය. එහෙත් මෙවන් කාරණාවලදී තමාට බලපෑමක් ඇති කරන අමිහිරි අත්දැකීම් වලට ඉඩ නොදෙන කිසිවෙක් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට සුදුසු නොවේ.

- හය වෙනුව.., **"දෙවියන් වහන්සේ පිළිබඳ අපගේ දැනුම වඩාත් විශ්වයජනක වන විට අනිත් මනුෂ්‍යයන්ට අපගේ සේවය වඩාත් සේ අවශ්‍ය වේ."**

මේ මහත් වූ දැනුම අත්මාර්ථකාමී ලෙස භුක්තිවිඳීමට ඉඩ ලබාදෙන්නේ නැත. අපි දෙවියන් වහන්සේව වඩාත් පරිපූර්ණ ලෙස හඳුණන තරමට අලුතින් සොයාගත් දැනුම දුක්විඳින මනුෂ්‍ය වර්ගයා කෙරෙහි ද දයාවේ ක්‍රියාවන් බවට පරිවර්තනය කිරීමේ ආශාව අපට වැඩි වැඩියෙන් දැනෙනු ඇත. අපට සියල්ල ලබා දුන් දෙවියන් වහන්සේව අපි වඩා හොඳින් දැනගන්නා විට අප තුලින් උන්වහන්සේ සියල්ල ලබාදීමට ක්‍රියා කරන සේක.

මෙතෙක් අපි සලකා බැලුවේ පුද්ගලයෙක් දෙවියන් වහන්සේ සමඟ පවත්වා ගත යුතු පුද්ගලික සම්බන්ධතාවයයි. එය මනුෂ්‍යයෙකුගේ දකුණු අතේ සුවඳ තෙල් ආලේපය මේන් දෙවියන් වහන්සේ පිළිබඳ ගැඹුරු වැටහීමක් ඇති කිතුණු ප්‍රජාව තුලින් ඔවුන් අවට සිටින අයට වේගයෙන් බලපෑමක් කරනු ඇත. තවද අපගේ වැඩිවන ආලෝකය දෙවියන් වහන්සේගේ ගෘහයේ සෙසු සාමාජිකයන් සමඟ බෙදා ගැනීමට අපි අරමුණු සහගතව සෙවිය යුතුය.

දේවරාජ්‍යය උදෙසා කරන අපගේ සියලුම සේවාවාන්හි දෙවියන් වහන්සේගේ මහිමය පිළිබඳව පූර්ණ අවධානයක් තබා ගැනීම අපට කළ හැකි හොඳම දෙයයි. අපගේ පුද්ගලික යාච්ඤාවන් දෙවියන් වහන්සේ සමඟ පැවතිය යුතුව තිබෙනවා පමණක් නොව අපගේ සාක්ෂි දැරීම අපගේ ගායනය , අපගේ දේශනා කිරීම, අපගේ ලිවීම, අපගේ ශුද්ධ වූ ස්වාමීන් වහන්සේගේ පුද්ගලිකත්වය වටා කේන්ද්‍රවිය යුතු අතර උන්වහන්සේගේ ගෞරවයේ සහ බලයේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව නොකවඩා ප්‍රශංසා කළ යුතුය. මහිමාන්විත ස්වාමියෙක් ස්වර්ගීය මහරජුගේ සංහාසනයේ දකුණු පැත්තේ අපව නියෝජනය කරනු ලබන සේක. අපි මනුෂ්‍යයන් අතර කාලයකට ජීවත්වන්නෙමු. අපි ජීවත්වන්නා වූ කාලයේ දී ක්‍රිස්තුස් වහන්සේව මෙහිදී විශ්වාසවන්තව නියෝජනය කරමු.

"කඳුළු සහිතව වපුරන්නෝ ප්‍රීතියෙන් කපන්නෝය." (ගීතාවලිය 126:5)

Reg. No: Dop/News/36/2024
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

පසුගිය කලාපයෙන්

පාපයේ ප්‍රයෝගකාරී බව

තමා බුද්ධිමත් සහ තමාට අත්දැකීම් ඇති බවත්. තාමට ආරක්ෂිත යැයි සිතන ස්ථානයක තමාට නතර විය හැකි බවත්ය. මේ සළඹයාට ඉටිපන්දම සමඟ සෙල්ලම් කළ හැකි අතර පියාපත් ගින්නෙන් දැවී යන්නේ නැතැයි සිතති. පාපයේ රැවටිලිකාරකම කොපමණ තදට බැඳතැබුවත් එය ඉතා අනතුරු සහිතය. අපිත් පාපයේ දැඩි නොවන පිණිස කරුණාව උදෙසා සෝද්සියෙන් බලා සිටිමින් යාච්ඤා කරමු.

ඔබව මුලාවට හසුකරගන්නේ මෙසේය. පාපයත් එකතුවී සියල්ලට පසු ඔබ වැරදි වුවත් ඔබ විය හැකි තරම් නරක නැත. පරීක්ෂාව සලකා බලන විට ඔබගේම මධ්‍යස්ථභාවය ගැන ඔබ පුදුම විය හැකිය. සමස්තයක් වශයෙන් ඔබ අනිත් අයට වඩා හොඳින් හැසිරී ඇතැයි සිතති. පව්කාරයා තම පාපයේ මකුළුදැල් වස්ත්‍රයක් ලෙස පැළඳගෙන සිටියි. අපගේ දුර්වලකම් වලින් පිටතදී වුවත් අතින් හැඩග ස්වන්නා වූ තම ධර්මිෂ්ඨකම දිළිඳු දෙයක් වීමට **පුළුවන. පාපයේ ප්‍රයෝග සහිත බව** තුලින් පාපය ප්‍රශංසනීය දෙයක් බව පෙන්වයි.

ඊළඟට ඔබට අහිමි වූ කාලය ඉක්මනින් පිරිමසා ගත හැකි යැයි පාපය ඔබට යෝජනා කරනු ලබයි. දෙවියන් වහන්සේට වඩා ළංව සහ වඩාත් ඵලදායී වනු ඇතැයි පෙන්වනු ලබයි. (ආදම් සහ ඒවට මෙන්) එවිට එමගින් ඔබගේ වෙන්වීයාම ඉක්මනින් සෑදෙනු ඇත. සමාවදීම සඳහා වටිනාකමක් යෝජනා කිරීම පවා අපහසු දෙයක් ලෙස ඉක්මනින් පෙන්වනු ඇත.

ව්‍යාජ පොරොන්දු

පාපයේ ප්‍රයෝගකාරී බව එහි පොරොන්දු වලින් ප්‍රකාශ වේ. මක්නිසාද එය අපට කොයිතරම් මහත්ව තිබෙනවාදැයි සොයා නොගෙන අපි පාපයේ බොහෝ දුර ගමන් කරන්නේ නැත. ඒවා නිදහස් පොරොන්දු වන අතර ඊට යටත්වන මනුෂ්‍යයා සෑම අතින්ම වහලෙක් බවට පත්වේ. පාපය ආලෝකයට පොරොන්දු වන අතර මනුෂ්‍යයා නව ආලෝකය පසුපස යාමට පැරණි ඇදහිල්ල අත්හරිනු ලබයි. වැඩි වේලාවක් ගතවීමට පෙර මධ්‍යම රාත්‍රියේ හත්ගුණයක් වැඩි කළු සහ අන්ධකාරය ඔහු වටා ඇතිවේ. පාපය, මනස සහ ආත්මය උසස් කිරීමට පොරොන්දු වන අතර වැඩිකල් යන්නට මත්තෙන් මහත් කාලකණ්ණි, ලෞකික විනෝදයට ආදරය කරන, ගොරවන මිත්‍යා විශ්වාස කිරීමට පැමිණෙයි. පාපය එහි පොරොන්දු වන කිසිවක් ඉටු නොකරයි.

මුදා ගැනීම පවසනවා පමණකි. ශුද්ධකම සැබෑවකි. එහෙත් පාපය බොරුකාරව තිබේ. එය සතුටුදායක පොරොන්දු ලබාදෙන නමුත් ඇති කරනු ලබන්නේ කාලකණ්ණිකමයි. ස්වර්ගයක් මවා පෙන්වන නමුත් ඇති කරන්නේ අපායයි.

ඔබව සැබෑව මත රඳවා ගැනීමට ස්වාමීන් වහන්සේ තුළ විශ්වාසය ඇතිව සිටින්න. තමාව මුලා කළ නොහැකි යැයි කිසිවෙක් නොසිතිය යුතුය. එලෙස සිතන්නා වූ අය දැනටමත් තමාගේ උඩඟුකමෙන් රැවටී සිටිති. පාපයෙන් රැවටීමට නොහැකි පරිපූර්ණ තත්වයකට පැමිණ ඇති බව කිසිදා කාන්තාවක් සිහිනෙන්වත් නොසිතය යුතුය. එලෙස සිතන්නා වූ කාන්තාවන් මේ වන විටත් සිටින්නේ අන්තරායක ආසන්නයේය. අපට විරුද්ධව කපටි සතුරෙකු සිටින අතර පැරණි සර්පයාගේ සූක්ෂම බව සහ පාපයේ සමානකම සමකිරීමට අපගේම බුද්ධියට නොහැකිය. අපි දෙවියන් වහන්සේගේ ප්‍රඥාව වන උන්වහන්සේගේ උපකාරය ඉල්ලා නොසිටියොත් අපව ගවයෙකු මෙන් මරණයට ගෙන ගොස් අපගේ මෝඩකමෙන් විනාශ වන්නෙමු.

ප්‍රායෝගික නිරීක්ෂණ

පාපයේ රැවටිලිකාරකම සහ දැඩිවීමේ ප්‍රවණතාවයට විරුද්ධව සටන් කළ යුතුය. එය කළ යුත්තේ කෙසේද ?

සිතේ දැඩි බවින් සහ පාපයේ රැවටිලිකාර බවින් වැලකී සිටීමේ මාර්ගය විශ්වාස කිරීමෙනි. දේව වචනයේ අපි මෙසේ කියවන්නෙමු. **"තමන්වහන්සේගේ විශ්‍රාමස්ථානයට ඔවුහු ඇතුල් නොවන්නෝ යයි උන්වහන්සේ දිවුරුවේ අකීකාර වූ තැනැත්තන් ගැන නොවේද ? මෙසේ නොඇදහිලිකාරකම නිසා ඔවුන්ට ඇතුල්වෙන්නට නුපුළුවන් වූ බව අපට පෙනෙන්නේය."** (හෙබ්‍රෙව් 3:18-19) ඇදහිල්ල කරුණුකොටගෙන ඔබව මුදාගෙන ඇති බව විශ්වාස කරන්න. ඇදහිල්ල ඔබව මුදාගන්නට යන බවත් විශ්වාස කරන්න. ඇදහිල්ල ඔබව ක්‍රිස්තුස් වහන්සේ වෙතට ගෙන එන්නේය. ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ පවතින බව විශ්වාස කරන්න.

වර්තමාන පරීක්ෂාවලට විරුද්ධව සිටින බව විශ්වාස කරන්න. පාපයේ අනාගත සියලු ප්‍රයෝගකාරකම්වලට විරුද්ධව සිටින බව විශ්වාස කරන්න. ඇදහිල්ලේ ශක්තිය වර්ධනයවීමේ ප්‍රමාණයත්, පාපයේ මුලා කිරීම වලක්වන ප්‍රමාණයත් ඔබට සොයාගත හැකිය.

ජීවමාන දෙවියන් වහන්සේ තුළ සහ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම තුළ විශ්වාස තබන්න. උන්වහන්සේට ඔබගේ බැඳී සිටීම තුළ විශ්වාසය තබන්න. එවිට පාපයේ අධික බව ප්‍රකාශවේ. ක්‍රිස්තුස් වහන්සේ තුළ විශ්වාස කරන්න. උන්වහන්සේ ඔබගේ පාපය රැගෙන එය ගස පිටදී තමන්වහන්සේගේ ශරීරයෙන් ඉසුලූ සේක. පාපයේ කළුපාට (අඳුරු බව) දකින්න. ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය කරුණුකොටගෙන පාපයේ ප්‍රයෝගකාරී බවින් ඔබව මුදවා ගැනීමට හැකි බව විශ්වාස කරන්න. ඔබ විශ්වාස කරන පරිදි ඔබට එය සිදුවේ. භාගෙට විශ්වාස කරන ලිස්සා යන්නා වූ ස්ථානවලදී ඔබ ස්ථීරව සිටිය යුතුය.

මම ඔබට දෙන මීළඟ අවවාදය මෙයයි. ඔබ පාපයේ ප්‍රයෝගයෙන් ගැලවීම ලබන්නට නම් අවංකව දෙවියන් වහන්සේ ඉදිරියේ පසුතැවිලි විය යුතුය. ජීවමාන දෙවියන් වහන්සේ ඉදිරියේ ඔබගේ හදවත විවෘත කළ යුතුය.

ඔබගේ දුෂ්ඨකමේ නපුර ගැන පසුතැවිලි වෙන්න. මක්නිසාද යටහත්කමින් කරන්නා වූ මෙම පසුතැවිලිවීමට සමාව ලබාදෙනවා පමණක් නොව අනාගත පාරිශුද්ධභාවය සඳහා එය ඔබගේ මාර්ගය ද වනු ඇත. දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ මෙය ඔබට උගන්වන සේක.

නැවතත් හදවතේ මෘදු මොළොක් බව වගාකරන්න. මා සම්බන්ධයෙන් පැසුණු බඩ ඉරිඟු ග්‍රීස්ම සුළඟට වැනෙන්නාක් මෙන් මම දෙවියන් වහන්සේගේ වචනයට හසුවන්නෙමි. මම දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන මද සුළඟින් සෙළවෙන්නා වූ කොළ මෙන් සෙලවෙන්නෙමි.

මම මගේ ස්වාමීන් වහන්සේගේ කරුණාව මත පවතිනවා නම් ඒ කරුණුකොටගෙන අපි එකිනෙකාව ධෛර්යමත් කිරීමට උත්සාහ ගන්නෙමු. ඇදහිලිවන්තයන්ට ඔවුන්ගේ මිතුරන්ගේ සන්නිවේදන සම්බන්ධතාවය තුලින් වඩා හොඳින් වර්ධනය විය හැකි වේ.

නමුත් ප්‍රිය මිත්‍රවරුණි. මා කී සියල්ලෙන් පසු ස්වාමීන් වහන්සේ විසින් රකින තැනැත්තාව හොඳින් තබා ඇත. ඔබව පැකිලිලීමෙන් වළක්වන්නට පුළුවන් වූ ශුද්ධාත්මයාණන් වහන්සේ වන ස්වාමීන් වහන්සේට කැපවෙන්න.

සියලු අසත්‍යයෙන් සහ පාපයෙන් ඔබව ගලවා ගැනීමටත්, අවසානය දක්වා ඔබව සත්‍යවාදීව තබා ගැනීමටත් විශ්වාසවන්ත සැබෑ සාක්ෂිකරු වන උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන්න.

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැඟී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.